*සැ. යු.*– 2006.05.26 වැනි දින පළ කරන ලද අංක 1,447 දරන *ගැසට් පත්‍රයේ* IV (අ) කොටස පළ නොකරන ලදී.


# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,448 - 2006 ජූනි 02 වැනි සිකුරාදා - 2006.06.02**

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (IIආ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන ම පිටු අංක යොදා ඇත.)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... ... | 630 | ආණ්ඩුවේ නොවන දැන්වීම් ... ... .. | 633 |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... | — | රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... ... | 631 | වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් .. ... ... | 633 |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... | — | විවිධ දැන්වීම් ... ... ... | — |


*සැ. යු..*– තේ පර්යේෂණ මණ්ඩල (සංශෝධන ) පනත් කෙටුම්පත 2006 අප්‍රේල් මස 07 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

*ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි* සෑම කොටසකටම අග පිටුවෙහි සෑම මාසයකම මුල් සතියේ දී පළ කරනු ලබන ගැසට් නිවේදන බාර ගන්නා අවසාන දිනය සහ වේලාව සඳහන් නිවේදන කෙරෙහි ඔබගේ අවධානය මින් යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* සෑම කොටසකම පළකළ යුතු *ගැසට් නිවේදන* භාර ගන්නා වේලාව, *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන සිකුරාදා දිනට සති දෙකකට පෙර එළඹෙන සිකුරාදා දිනයෙහි දහවල් 12ට අවසන් කරනු ලැබේ. තනතුරු –ඇබෑර්තු, ටෙන්ඩර් දැන්වීම්, වෙන්දේසි පිළිබඳ දැන්වීම් යනාදියෙහි සඳහන් කරනු ලබන අවසාන දිනය සහ වේලාවන් ඊට අනුරූපව - එනම් දැන්වීම්, රජයේ මුද්‍රණාලයට එවන සහ එම දැන්වීම් පළ කරන දින අතර සෑහෙන කාල වේලාවක් දෙමින් එම දැන්වීම්වල සඳහන් කරුණු කෙරෙහි උනන්දුවක් දක්වන සෑම කෙනෙකුටම ප්‍රයෝජනවත් වන පරිදි ඊට සහභාගිවීමට ඉඩ ප්‍රස්ථාවක් සැළසෙනසේ සකස් කරන මෙන් සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල යනාදියෙන් මින් ඉල්ලා සිටිනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම පිණිස එවන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන දිනට සති දෙකකට පෙර–එනම් 2006 ජූනි මස 09 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයට* යායුතු දැන්වීම් 2006 මැයි මස 26 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර රජයේ මුද්‍රණාලයට ලැබෙන සේ එවිය යුතුයි.

**ලක්ෂමන් ගුණවර්ධන**,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

2006 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

## ශ්‍රී ලංකා දුම්රිය සේවය

### ශ්‍රී ලංකා දුම්රිය සේවයේ ට්‍රැක්ෂන් මෝටර් ආමේචර් 8 ක් (Repairing of 8 Nos. Traction Motor Armature of M7 Class Locos) අළුත්වැඩියා කිරීම සඳහා වූ ටෙන්ඩරය

ශ්‍රී ලංකා දුම්රිය සේවයේ ට්‍රැක්ෂන් මෝටර් ආමේචර් 8 ක් (repairing of 8 Nos. traction motor armature of M7 class locomotives) අළුත්වැඩියා කිරීම සඳහා කොළඹ 10, තැ. පෙ. 355, ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව, දුම්රිය මූලස්ථානය, දෙපාර්තමේන්තු ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් මුද්‍රා තබන ලද ටෙන්ඩර්පත්, නිෂ්පාදකයින්ගෙන්/සැපයුම්කරුවන්ගෙන් සහ සුදුසුකම් ලත් සංවිධාන වෙතින් භාරගනු ලබයි. නිෂ්පාදකයින්ට, ඔවුන්ගේ මිළ ගණන් කෙලින්ම හෝ ඔවුන් විසින් ඇටෝර්නි බලය පවරන ලද ශ්‍රී ලංකාව තුල ලියාපදිංචි නියෝජිතයෙකු මාර්ගයෙන්ද ඉදිරිපත් කළ හැක.

2. ටෙන්ඩර්පත් භාරගන්නා අවසාන දිනය 2006.07.06 දින ප.ව. 2.00 දක්වා වේ.

3. කොළඹ 10, ඕල්කොට් මාවත, දරන ලිපිනයේ පිහිටි දුම්රිය ගබඩා අධිකාරී කාර්යාලය වෙත 2006.07.05 දින ප. ව. 3.00 වන තෙක් ආපසු නොගෙවනු ලබන රු. 2,500 ක ටෙන්ඩර් ගාස්තු මුදලක් ගෙවා ලබාගන්නා ලද ආකෘති මත ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය.

4. ටෙන්ඩර්පත් විවෘත කිරීම, ටෙන්ඩර්පත් භාරගැනීම අවසන් වූ විගස ශ්‍රී ලංකාව, කොළඹ 10, ඕල්කොට් මාවත, දුම්රිය මූලස්ථානයේදී සිදු කෙරේ. ටෙන්ඩර්පත් විවෘත කරන අවස්ථාවට ටෙන්ඩර්කරුට හෝ ඔහුගේ බලයලත් නියෝජිතයාට සහභාගීවීමට අවසර දෙනු ලැබේ.

5. මුද්‍රා තබන ලද ටෙන්ඩර්පත් පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනවිත් භාරදීම හෝ කළ හැකිය :

සභාපති, දෙපාර්තමේන්තු ටෙන්ඩර් මණ්ඩලය,<br>
ශ්‍රී ලංකා දුම්රිය සේවය, දුම්රිය මූලස්ථානය,<br>
තැ. පෙ. 355, කොළඹ 10, ශ්‍රී ලංකාව.

6. ශ්‍රී ලංකාව, කොළඹ 10, ඕල්කොට් මාවතේ පිහිටි දුම්රිය ගබඩා අධිකාරී කාර්යාලයේ දී ටෙන්ඩර් ආකෘති පත්‍ර අය කිරීමකින් තොරව පරීක්ෂා කළ හැක.

7. වැඩි විස්තර සඳහා, දුම්රිය ගබඩා අධිකාරී, දුම්රිය ගබඩා දෙපාර්තමේන්තුව, තැ. පෙ. 1347, ඕල්කොට් මාවත, කොළඹ 10, ශ්‍රී ලංකාව යන ලිපිනයෙන් විමසන්න.

දුරකථන අංක : 94(11) 2432044 හෝ 94(11) 2436818

යොමු අංකය : එස්. ආර්. එස්/එෆ්. 6489.

සභාපති.<br>
දෙපාර්තමේන්තු ටෙන්ඩර් මණ්ඩලය,<br>
ශ්‍රී ලංකා දුම්රිය සේවය.

06-20

## ශ්‍රී ලංකා දුම්රිය සේවය

### ශ්‍රී ලංකා දුම්රිය සේවයට තිරිංග කට්ටල (Low Friction Composite Brake Blocks) 24,000 ක් සැපයීම සඳහා වූ ටෙන්ඩරය

ශ්‍රී ලංකා දුම්රිය සේවයට තිරිංග කට්ටල (Low Friction Composite Brake Blocks) 24,000 ක් සැපයීම සඳහා, ශ්‍රී ලංකාව, කොළඹ 10, ඕල්කට් මාවතේ තැ. පෙ. 355, ශ්‍රී ලංකා දුම්රිය සේවයේ, දුම්රිය මූලස්ථාන, ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් මුද්‍රා තබන ලද ටෙන්ඩර්පත්, නිෂ්පාදකයින්ගෙන් හා/හෝ සැපයුම්කරුවන්ගෙන් භාරගනු ලබයි. නිෂ්පාදකයින්ට, ඔවුන්ගේ මිල ගණන් ඔවුන් විසින් ඇටෝර්නි බලය පවරන ලද නියෝජිතයෙකු මාර්ගයෙන්ද ඉදිරිපත් කළ හැක.

2. ටෙන්ඩර්පත් භාර ගන්නා අවසාන දින 2006.07.13 දින ප. ව. 2.00 දක්වා වේ.

3. ශ්‍රී ලංකාව, කොළඹ 10, ඕල්කොට් මාවත, දරන ලිපිනයේ පිහිටි දුම්රිය ගබඩා අධිකාරී කාර්යාලය වෙත හෝ පිටරටවල පිහිටි ශ්‍රී ලංකා තානාපති කාර්යාල වෙත 2006.07.12 දින ප.ව. 3.00 වන තෙක් ආපසු නොගෙවනු ලබන රු. 2,500 ක ටෙන්ඩර් ගාස්තු මුදලක් ගෙවා ලබාගන්නා ලද ආකෘති මත ටෙන්ඩර් ඉදිරිපත් කළ යු.තුය.

4. ටෙන්ඩර්පත් භාරගැනීම අවසන් වූ විගස ශ්‍රී ලංකාව, කොළඹ 10, ඕල්කොට් මාවතේ පිහිටි දුම්රිය මූලස්ථානයේ දී ටෙන්ඩර්පත් විවෘත කරනු ලැබේ. ටෙන්ඩර්පත් විවෘත කරන අවස්ථාවට ටෙන්ඩර්කරුට හෝ ඔහුගේ බලයලත් නියෝජිතයාට සහභාගීවීමට අවසර දෙනු ලැබේ.

5. මුද්‍රා තබන ලද ටෙන්ඩර්පත් පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් හෝ අතින් ගෙනවිත් භාරදීම හෝ කළ හැකිය :

සභාපති - ටෙන්ඩර් මණ්ඩලය,<br>
ශ්‍රී ලංකා දුම්රිය සේවය, දුම්රිය මූලස්ථානය,<br>
තැ. පෙ. 355, කොළඹ 10, ශ්‍රී ලංකාව.

6. ශ්‍රී ලංකාව, කොළඹ 10, ඕල්කොට් මාවතේ පිහිටි දුම්රිය අධිකාරී කාර්යාලයේ දී ටෙන්ඩර් ආකෘති පත්‍ර අයකිරීමකින් තොරව පරීක්ෂා කළ හැක.

7. වැඩි විස්තර සඳහා දුම්රිය ගබඩා අධිකාරී, දුම්රිය ගබඩා දෙපාර්තමේන්තුව, තැ. පෙ. 1347. ඕල්කොට් මාවත, කොළඹ 10, ශ්‍රී ලංකාව යන ලිපිනයෙන් විමසන්න.

දුරකථන අංක : 094(11)2432044 හෝ 94(11) 2436818

යොමු අංකය : එස්.ආර්./එස්/එෆ්. 6515.

සභාපති,<br>
ටෙන්ඩර් මණ්ඩලය,<br>
ශ්‍රී ලංකා දුම්රිය සේවය.

06-21

### ශ්‍රී ලංකා දුම්රිය සේවය

ශ්‍රී ලංකා දුම්රිය සේවයට තිරිංග කට්ටල (High Friction Composite Brake Blocks) 12,000ක් සැපයීම සඳහා වූ ටෙන්ඩරය

ශ්‍රී ලංකා දුම්රිය සේවයට තිරිංග කට්ටල (High Friction Composite Brake Blocks) 12,000ක් සැපයීම සඳහා ශ්‍රී ලංකාව, කොළඹ 10, ඕල්කට් මාවතේ, තැ. පෙ. 355, ශ්‍රී ලංකා දුම්රිය සේවයේ, දුම්රිය මූලස්ථාන ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් මුද්‍රා තබන ලද ටෙන්ඩර්පත් නිෂ්පාදකයින්ගෙන් හා/හෝ සැපයුම්කරුවන්ගෙන් භාරගනු ලබයි. නිෂ්පාදකයින්ට, ඔවුන්ගේ මිල ගණන් ඔවුන් විසින් ඇටෝර්නි බලය පවරන ලද නියෝජිතයෙකු මාර්ගයෙන් ද ඉදිරිපත් කළ හැක.

2. ටෙන්ඩර්පත් භාර ගන්නා අවසාන දිනය 2006.06.29 දින ප. ව. 2.00 දක්වා වේ.

3. ශ්‍රී ලංකාව, කොළඹ 10, ඕල්කොට් මාවත, දරන ලිපිනයේ පිහිටි දුම්රිය ගබඩා අධිකාරී කාර්යාලය වෙත හෝ පිටරටවල පිහිටි ශ්‍රී ලංකා තානාපති කාර්යාල වෙත 2006.06.28 දින ප. ව. 3.00 වන තෙක් ආපසු නොගෙවනු ලබන රු. 2,500 ක ටෙන්ඩර් ගාස්තු මුදලක් ගෙවා ලබාගන්නා ලද ආකෘති මත ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය.

4. ටෙන්ඩර්පත් භාරගැනීම අවසන් වූ විගස ශ්‍රී ලංකාව, කොළඹ 10, ඕල්කොට් මාවතේ පිහිටි දුම්රිය මූලස්ථානයේ දී ටෙන්ඩර්පත් විවෘත කරනු ලැබේ. ටෙන්ඩර්පත් විවෘත කරන අවස්ථාවට ටෙන්ඩර්කරුට හෝ ඔහුගේ බලයලත් නියෝජිතයාට සහභාගිවීමට අවසර දෙනු ලැබේ.

5. මුද්‍රා තබන ලද ටෙන්ඩර්පත් පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනවිත් භාරදීම හෝ කළ හැකිය :

සභාපති, ටෙන්ඩර් මණ්ඩලය, ශ්‍රී ලංකා දුම්රිය සේවය, දුම්රිය මූලස්ථානය, තැ. පෙ. 355, කොළඹ 10, ශ්‍රී ලංකාව.

6. ශ්‍රී ලංකාව, කොළඹ 10, ඔල්කොට් මාවතේ පිහිටි දුම්රිය ගබඩා අධිකාරී කාර්යාලයේ දී ටෙන්ඩර් ආකෘති පත්‍ර අය කිරීමකින් තොරව පරීක්ෂා කළ හැකිය.

7. වැඩි විස්තර සඳහා දුම්රිය ගබඩා අධිකාරී, දුම්රිය ගබඩා දෙපාර්තමේන්තුව, තැ. පෙ. 1347, ඕල්කොට් මාවත, කොළඹ 10, ශ්‍රී ලංකාව යන ලිපිනයෙන් විමසන්න.

දුරකථන අංක : 94 (11) 2432044 හෝ 94 (11) 2436818.

ෆැක්ස් අංකය : එස් ආර්. එස්/එෆ් 6517.

සභාපති,
ටෙන්ඩර් මණ්ඩලය.
ශ්‍රී ලංකා දුම්රිය සේවය.

06-22

---

## බඩු බාහිරාදිය විකිණීම්

### දිසා මහෙස්ත්‍රාත් අධිකරණය – අත්තනගල්ල

අධිකරණය වෙත ඉදිරිපත් කරනු ලැබූ භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

අත්තනගල්ල දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩුවලට අදාළව රාජසන්තක කරනු ලැබූ සහ හිමිකම් නොකියන ලද පහත සඳහන් භාණ්ඩ 2006.06.25 වැනි දින පෙ. ව. 10.00 ට මෙම අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

02. වෙන්දේසි කරනු ලබන කිසියම් භාණ්ඩයක් පිළිබඳව අයිතිවාසිකම් කියන්නෙකු වේ නම් ඒ පිළිබඳව වෙන්දේසිය පවත්වනු ලබන දින පෙ. ව. 9.00 සිට 10.00 දක්වා ස්වකීය අයිතිවාසිකම් ඉදිරිපත් කළ යුතුය.

03. වෙන්දේසිය ආරම්භ කිරීමට පැය 1/2 කට පෙර වෙන්දේසියේ විකිණීමට නියමිත භාණ්ඩ රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය පරිදි, මහජනයාට පරීක්ෂාකර බැලිය හැකි වේ.

04. වෙන්දේසියෙන් මිළදී ගන්නා භාණ්ඩ සඳහා ඒ අවස්ථාවේදීම මුදල් ගෙවා අධිකරණ භූමියෙන් ඉවත්කර ගත යුතු අතර සියළු ගෙවීම් මුදල්වලින් පමණක් කළ යුතුයි. චෙක්පත් ආදිය භාරගනු නොලැබේ.

05. අධිකරණය විසින් නියම කරනු ලබන ලන්සුව නොපිළිගැනෙන අවස්ථාවන්හි දී අධිකරණයේ අභිමතය පරිදි, එම භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කිරීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

06. වෙන්දේසියේ භාණ්ඩ මිලදී ගන්නා අය තමන්ගේ අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා ජාතික හැඳුනුම්පත රැගෙන ආ යුතුයි.

එස්. සුනන්ද හේරත්,
දිසා විනිසුරු හා මහෙස්ත්‍රාත්.

2006 මැයි මස 05 වැනි දින,
අත්තනගල්ල දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේදී ය.
නිට්ටඹුව.

### වෙන්දේසි කිරීමට නියමිත භාණ්ඩ ලැයිස්තුව

| | | |
|---|---|---|
| 01. | ඒආර් 91/04 | අංක 709 දරන පාපැදිය |
| 02. | ඒ 821/04 | සිල්ව පාට ස්පෝට් වර්ගයේ පාපැදිය |
| 03. | ඒ 1816/03 | පාපැදිය |
| 04. | 1819 | ලුමාලා වර්ගයේ පාපැදියක් |
| 05. | 1726 | පාපැදියක් |
| 06. | 1818 | ලුමාලා පාපැදිය |
| 07. | 1727 | කාන්තා පාපැදිය |
| 08. | ඒ/1977 | පාපැදි 02 |
| 09. | 1738/04 | පාපැදියක් |
| 10. | ඒ/1737/04 | පාපැදියක් |
| 11. | 35959 | බී/908 පාපැදියක් |
| 12. | 44609 | පාපැදියක් |
| 13. | අබලන් පාපැදි තොගයක් | |

*විවිධ -*

14. 45139 ගෑස් ලිප් 01
සිලින්ඩර් 01
15. ඒ/746/05 යකඩ කෑලි
16. 90447 ඇලුමිනියම් කළයක්
17. ඒආර්1549/03 ජංගම දුරකථනයක්
18. 68995 පුටු සෙට් 01 (ලී)
19. ඒ/823/04 කැසට් යන්ත්‍රයක් හා විදුලි පන්දමක්
20. ඒ/1140/00 සෙලියුලර් දුරකථනය
21. ඒ/1734/05 ඇඳුම් මලු 05
22. 39456 පිරිමි අත් ඔරලෝසු 02
23. 62595 සවල් 03, බාල්දි 03
24. ඒ/526/02 ඉස්කුරුප්පු නියනක්
25. ඒආර්/1820/03 ස්ප්‍රිං පිත් එකක්
26. ඒආර්/552/02 කැත්තක්
27. ඒ/1122/02 පිහියක්
28. ඒ/555 පිහියක්
29. ඒ575/00 පිහියක්
30. ඒ/550/02 පිහියක්
31. ඒ 553 මන්නා පිහියක්
32. ඒ/1393/02 පිහියක්
33. තඹ දගර තොගයක්
34. නඩු අංකය ඒ/539/03

අංක රහිත හොණ්ඩා යතුරු පැදිය
චැසි අංකය : ඒ. සී. 08- 1412274
එන්ජින් අංකය : ඒ. සී. 08 ඊ - 1332540

35. ඒ/1175/02
අංක 86 ශ්‍රී 2832 දරන හොණ්ඩා යතුරු පැදිය
චැසි අංකය : සී. බී. 125 කේ - 7067006
එන්ජින් අංකය : සී. බී. 125 කේ. ඊ. 7037062

36. ඒ/1011/03
අංක රහිත හීරෝ මැජෙස්ටික් වර්ගයේ යතුරු පැදිය
චැසි අංකය : සී. සී. බී. - 020072
එන්ජින් අංකය :289307

37. 47971
අංක 140-1935 දරන යමහා යතුරුපැදිය
චැසි අංකය : 17 ඩබ් - 358629
එන්ජින් අංකය : 5 ආර් 2 - 358629

38. ඒආර්/1305/04
අංක 156 -1812 දරන හොණ්ඩා යතුරුපැදිය
චැසි අංකය :සී 50 - 9715565
එන්ජින් අංකය : සී 50 ඊ - 9715730

39. ඒ653/02
අංක 115-1494 දරන හොණ්ඩා වර්ගයේ යතුරුපැදිය
චැසි අංකය : එම්. සී 08-1074445
එන්ජින් අංකය :-

40. ලොකු හිස් කෑන් තොගයක්
41. කුඩා හිස් කෑන් තොගයක්
42. බැරල්
43. හිස් බෝතල් තොගයක්

06-01

## මහෙස්ත්‍රාත් අධිකරණය - වරකාපොල

වරකාපොල අධිකරණ සංකීර්ණයේ ගොඩනැගිලිවලින් ඉවත් කරන ලද පහත උපලේඛනයේ දැක්වෙන භාණ්ඩ 2006.06.24 වැනි දින පෙ. ව. 10.30 ට වරකාපොල අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

02. වෙන්දේසියට නියමිත භාණ්ඩ එදිනම වෙන්දේසියට පෙර පරීක්ෂා කර බැලිය හැකිය.

03. සියළුම භාණ්ඩ සම්බන්ධයෙන් වන අවසාන තීරණය වරකාපොල මහෙස්ත්‍රාත් අධිකරණයේ විනිසුරුතුමා සතුය.

04. වෙන්දේසියේදී මිලදී ගන්නා භාණ්ඩ සඳහා එම අවස්ථාවේ දීම මුදල් ගෙවා අධිකරණ භූමියෙන් ඉවත් කර ගතයුතුය. සියලුම ගෙවීම් මුදලින් කළ යුතු අතර, චෙක්පත් ආදිය භාරගනු නොලැබේ.

05. භාණ්ඩ මිලදී ගන්නා පුද්ගලයන් තම අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතුය.

අතිරේක දිසා විනිසුරු සහ මහෙස්ත්‍රාත්,
වරකාපොල.

2006 මැයි මස 08 වැනි දින,
වරකාපොල මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

### භාණ්ඩ ලැයිස්තුව

| | | |
|---|---|---|
| 01. | බාල්ක 9' 6"x3' 6" | 09 |
| 02. | යටලී 3" x 5" දිග 8' 0" | 34 |
| 03. | යකඩ බාල්ක (2" x 2" x 1/4" ඩබල්) දිග 20' 0" | 06 |
| 04. | මුදුන් යට ලී 2" x 7" දිග 8' 0" | 12 |
| 05. | ලෑලි දොර පියන් 3' 0" x 6' 6" | 04 |
| 06. | ලී රාමු සහිත 2" x 2" කොටු දැල් ජනේල (4' 9" x 5' ) | 02 |
| 07. | ලී රාමු සහිත 2" x 2" කොටු දැල් ජනේල (6' 0" x 6") | 05 |
| 08. | දිරාගිය උළුවහු කඳන් (2" x 4" උස 7' 0) | 13 |
| 09. | 2"x 2" කොටු දැල් (6' 0" x 6' 0") | 02 |
| 10. | යකඩ කූරු සහිත දොර 3' 0" x 7' 0" | 01 |
| 11. | ලෑලි, පළල 0' 9" දිග 3' 6" | 11 |
| 12. | ලෑලි, පළල 0' 7" දිග 7' 6" | 09 |
| 13. | කැඩී දිරාගිය දොර පියන් | 04 |
| 14. | කුරුපා 4' x 6" දිග 2' 0" | 09 |
| 15. | මුදුන් උළු කැට | 78 |
| 16. | පොල් ලී පරාල දිග 12' 0" | 103 |
| 17. | දොර පියන් (2' 3" x 6' 6") | 01 |
| 18. | වීදුරු ජනෙල් පියන් ( 1' 8" x 4' 6") | 06 |
| 19. | ගලවා ඉවත් කළ දිරා ගිය රිප්ප තොගය | |
| 20. | ගලවා ඉවත් කළ දිරා ගිය ටකරන් තොගය | |
| 21. | ගලවා ඉවත් කළ දිරා ගිය සිවිලින් ෂීට් තොගය | |
| 22. | වීදුරුව රහිත (1' x 0 x 1' x 6") ෆෑන් ලයිට් | 01 |
| 23. | ගලවා ඉවත් කළ විදුලි පංකා | 05 |
| 24. | ප්ලාස්ටික් ආවරණය සහිත ටියුබ් ලයිට් | 01 |
| 25. | ගලවා ඉවත් කරන ලද පොල් ගස් | 05 |

06-18

# ආණ්ඩුවේ නොවන දැන්වීම්

## ඇටෝනි බලය අවලංගු කිරීම

දැනට ජා ඇල කණුවන පිල්ප්නේරි පාර, 30/1 පදිංචි, ජෙරාඩ් නිමල් කෝට්ටෙගේ වන මම කේ. කේ. කේ. අමරදාස නොතාරිස් 1992 ජූලි 27 සහතික කළ අංක 384 දරන එසේම 2004 අගෝස්තු 17 දින 283/94 දරන දින පොතේ 10398 යටතේ ලියාපදිංචි වී තිබෙන ඇටෝනි බලපත්‍රය මගින් ජා ඇල කණුවන, 65, ශාන්ත ජෝශප් වීදියේ පදිංචි කෝට්ටෙගේ අර්ල් තිලක් කරවාජු වෙත පවරන ලද ඇටෝනි බලය 2006 මැයි මස 10 දින සිට අවලංගු කළ බවත් එදිනට පසු ඔහු විසින් කරනු ලබන කිසිදු ක්‍රියාවකට මා වග නොකියන බවත් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට හා මහජනතාවට මින් දන්වා සිටිමි.

ජෙරාඩ් නිමල් කෝට්ටෙගේ.

06-112

## ඇටෝනි බලය අවලංගු කිරීම

පිලියන්දල, මඩපාත, කහපොල, කහපොල පාරේ, අංක 222/2, හි වික්‍රමපාල හේවාවිතාරන වන මම 1995.05.03 දාතම වූ කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ජේ. ඒ. ආර්.වීරසිංහ විසින් අත්සන් සහතික කරන ලද ඇටොර්නි බලපත්‍රය මගින් ස්කොට්ලන්තයේ කේ. වයි. 12 9 ඩී. ඩබ්ලිව්. ඩන්පර්මිලයින් කාසල්බ්ලෙයාර් පාර්ක්, අංක 27 හි (No. 27, Castleblair, PARK Dunfermline KY 12 9 DW, Scotland) එලිසබෙත් ඇන් හේවාවිතාරන මාගේ නීත්‍යානුකූල ඇටෝර්නි බලකරු වශයෙන් පත් කරනු ලැබ සිටි බවත්, එකී ඇටෝර්නි බලපත්‍රය අද දින සිට අවලංගු කර ඇති බවත් මෙයින් මම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත් එක්සත් රාජධානි රජයටත් ස්කොට්ලන්ත බලධාරීන්ටත් එකී දේශයන්හි පොදු මහජනතාවටත් දන්වා සිටිමි.

06-81

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

## සීමාසහිත සෙලාන් බැංකුව – පරණ යෝන් වීදිය ශාඛාව

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

පදිංචියට සුදුසු ඉතා වටිනා දේපලක්

වත්තල ප්‍රාදේශීය සභා පමුණුගම උප කාර්යාල සීමාවන් තුළ පරණ අම්බලම ගමේ පිහිටි " ගල්බානතොටේ දොඹගහවත්තේ " කොටස නමැති බෙදූ ඉඩම් කොටස හා එහි තුල පිහිටි අනෙකුත් සියලු දේ ඉඩමේ ප්‍රමාණය පර්චස් 83.1 යි

මෙම දේපල වත්තල පදිංචි බැස්ටියන් කෝරාලලාගේ ඇලෙක්සිස් පියනන්ද රුදිගු සහ අගම්බරම් සෙන්තිල්කුමාර් යන අය බන්ධනදායීන් වශයෙන් සී/ස සෙලාන් බැංකුව වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත..

ඉහත සඳහන් දේපල 2006 ජුනි මස 21 වැනි දින පෙරවරු 10.30 ට එම දේපල පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*ඉඩමට පිවිසීම.–* මීගමුව මාර්ගයේ හැඳල හන්දියෙන් හැරී ඇලකන්ද හන්දිය දක්වා ගමන්කොට දකුණු දෙසට හැරී කැනල් පාරට ( Canal Road) පිවිස බෝපිටිය පල්ලිය පාර දක්වා පැමිණ ඉදිරියට ස්වල්ප දුරක් ගමන්ගත් විට බෝපිටිය –කොළඹ මාර්ගය හමුවේ. මෙහිදී දකුණට හැරී බෝපිටිය දෙසට සැතපුම් 1/2ක් පමණ ගමන්ගත් විට අදාල දේපළ පිහිටා තිබේ.

යෝජනා සම්මුතිය සඳහා 2004.12.10 වන දින රජයේ *ගැසට් පත්‍රයේ* ද, 2004.08.27 වන දින ද දිණමින සහ ඩේලිනිව්ස් සහ තිනකරන් යන පුවත් පත් බලන්න.

*ගෙවීමේ ක්‍රමය.–* විකිණීම ස්ථිර කළ වහාම පහත සඳහන් අවසන් වූ වහාම පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු පරිදි මුදලින් ගෙවීම් කළ යුතුය.

(1) ගැණුම් මිලෙන් 10%ක් (සියයට දහයක්), (2) ප්‍රාදේශීය සභා බදු සඳහා සියයට එකයි 1%ක් (සියයට එකක්), (3) වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් 2 5% (සියයට දෙකහමාරක්), (4) නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2,000, (5) ලිපිකරු සහ සෝෂක වේතන රු. 500, (6) සියලුම ප්‍රචාරක වියදම් ද ගැණුම් මිලෙන් ඉතිරි 90% ද විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත සීමාසහිත සෙලාන් බැංකුවට ගෙවා නිම කළ යුතු ය.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න. ප්‍රධාන කළමණාකරු (නීති), සී/සසෙලාන් බැංකුව,

දුරකථන : 011-47012291, 110-4701275-011-2456258, 0777-736452

අයි. ඩබ්. ජයසූරිය,<br>
ප්‍රසිද්ධ වෙන්දේසිකරු.<br>
අංක 83/5, බෝමලුව පාර,<br>
වටපුළුව, මහනුවර.

සෙලින්කෝ සෙලාන් ටවර් ගොඩනැගිල්ල,<br>
අංක 90, ගාලු පාර, කොළඹ 03.

06-113/1

## කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලොන් ලිමිටඩ් –( නාවලපිටිය ශාඛාව)

### 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

ඉතා වටිනා කෘෂිකාර්මික දේපලක්

ගහ ඉහල කෝරලේ ප්‍රාදේශීය සභා සීමාවන් තුල හෙරකොල ගමේ පිහිටි “ ලැන්ටන් හිල් ‘බී’ එස්ටේට් ”නමැති ඉඩමෙන් බෙදූ කොටසක් හා එහි තුල පිහිටි ගහකොල වැවිලි ඇතුළු අනෙකුත් සියලු දේ. ඉඩමේ ප්‍රමාණය අක්කර 17, පර්චස් 18 යි.

මෙම දේපල වන්නිආරච්චිගේ කමල් රෝහණ පොන්සේකා යන අය බන්දනදායී ලෙසට කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

2006 ජුනි මස 30 වැනි දින පෙරවරු 11.00 ට එම දේපල පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2006.03.10 වන දින රජයේ *ගැසට් පත්‍රයේ* ද, 2006.03.06 වන දින ද අයිලන්ඩ් සහ තිනකුරන් පුවත්පත් සහ 2006.03.07 වන දින ලංකාදීප යන පුවත් පත් බලන්න.

*ඉඩමට පිවිසීම.*– ගම්පොල නගරයේ සිට දොළොස්බාගේ මාර්ගයේ කිලෝමීටර් 6ක් පමණ ගල්පාය දක්වා ගමන් කර වමට ඇති තෙලිහුන්න ගොවිජනපදය පාරට හැරී කිලෝ මීටර් 2.5ක් පමණ ගමන්කර නැවත වමට හැරී ලැන්ටන් හිල් එස්ටේට් වෙත දිවෙන බොරළු කරත්ත පාරට පිවිස මීටර් 500 ක් පමණ ගමන් කළ විට අදාල දේපල පිහිටා තිබේ.

*ගෙවීමේ ක්‍රමය.*– විකිණීම ස්ථිර කළ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතු වේ.

(1) ගැණුම් මිලෙන් 10%ක් (සියයට දහයක්), (2) ප්‍රාදේශීය සභා බදු සඳහා 01% (සියයට ) (3) වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් 2. 5% (සියයට දෙකහමාරක්), (4) නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2,000, (5) ලිපිකරු සහ සෝෂක වේතන රු. 500, (6) සියලුම ප්‍රචාරක වියදම් ද ගැණුම් මිලෙන් ඉතිරි 90% ද විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත කොමාර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් හි ප්‍රධාන කාර්යාලට හෝ නාවලපිටිය ශාඛාව වෙත ගෙවා නිම කළ යුතු ය.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න. කළමණාකරු කොමාර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ්, නාවලපිටිය, ශාඛාව.

අංක 92 සහ 92/1,
ගම්පොල පාර, නාවලපිටිය

අයි. ඩබ්ලිව්. ජයසූරිය,
අධිකරණ හා වාණිජ බැංකු පිළිගත් වෙන්දේසිකරු,

අංක 83/5, බෝමළුව පාර, වටපුළුව, මහනුවර.
දුරකථන : අංක 071-4755974, 071-4213497, 071-2755974

දුරකථනය : 0-54-2223961, 2223960
ෆැක්ස් : 054 – 2223963

06-113/2

---

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

### 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 53 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකිණීම පිළිබඳ දැන්වීම

ණය අංකය : 9/56685/ඉසැඩ්9/197.

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගනු ලැබුවාවූ ද, *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ* 2003.10.03 දින *ගැසට් පත්‍රයේ* සහ 2004.08.16 වැනිදා දිනමිණ පත්‍රයේ පළ කරනු ලැබුවා වූ ද, යෝජනාවකට අනුකූලව, ඉතිරිව ඇති ණය මුදල හා විකිණීමේ දිනය දක්වා අයවිය යුතු පොලිය, වියහියදම් හා යථෝක්ත පනතේ 57 වැනි වගන්තිය යටතේ ආපසු අයකර ගත යුතු මුදල් අයකර ගැනීම පිණිස, මෙහි පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති දේපළ හා භූමිය, මාතර, කොටුව, ශ්‍රී ධර්මාරාම මාවත, අංක 14හි බලයලත් වෙන්දේසිකාර එන්. එච්.පී. එෆ්. ආරියරත්න විසින් එම දේපල පිහිටි සථානයේ 2006.06.17 වෙනි දින පස්වරු 2.30 ට ප්‍රසිද්ධ වෙන්දේයේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

#### උපලේඛනය

මාතර දිස්ත්‍රික්කයේ, වැලිගම නගර සභා සීමාවන් තුළ පැලැන ග්‍රාමයෙහි, ගංගාරාම පාරේ, වරිපනම් අංක 681/1 දරන ස්ථානයේ පිහිටි පුහුලන්ගේ වත්ත හෙවත් ළිඳමුලවත්ත නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු එච්. ඩී. ජේ. පාලිත විසින් සැකසුණු 1992.09.30 දින හා අංක 2961ඒ දරන පිඹුරේ කැබලි අංක 1 ඒ ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් අ. 0, රූ.0, පර්. 23.2ක් වූ බෙදා වෙන් කරන ලද බිම් කොටස සහ ඒ මත පිහිටි සියලුම දේත් සමග වේ. මෙම ඉඩම් කොටස මාතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක ඩී 904/87 යටතේ ලියාපදිංචි කොට ඇත.

තවද, එකී අංක 2961 ඒ දරන පිඹුරේ දැක්වෙන මාර්ග අයිතීන් ද සමග වේ.

ඩබ්ලිව්. ඩී. මෙන්ඩිස්,
*වැඩ බලන* සාමාන්‍යාධිකාරි.

2006 මැයි මස 19 වැනි දින,
ගාලු පාරේ අංක 269,
කොළඹ 3.

06-111/6

---

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

### 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 53 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකිණීම පිළිබඳ දැන්වීම

ණය අංකය : ජේ/27853/ඩබ්ලිව්6/695

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගනු ලැබුවාවූ ද, *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ* 2006.01.12 දින *ගැසට් පත්‍රයේ* සහ 2006.02.20 වැනිදා දිනමිණ

පත්‍රයේ පළ කරනු ලැබුවා වූ ද, යෝජනාවකට අනුකූලව, ඉතිරිව ඇති ණය මුදල හා විකිණීමේ දිනය දක්වා අයවිය යුතු පොලිය, වියහියදම් හා යථෝක්ත පනතේ 57 වැනි වගන්තිය යටතේ ආපසු අයකර ගත යුතු මුදල් අයකර ගැනීම පිණිස, මෙහි පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති දේපළ හා භූමිය, පානදුර, ඩයස් ගොඩනැගිල්ලෙ හි බලයලත් වෙන්දේසිකාර එච්. ගිල්ටන් පෙරේරා විසින් එම එම දේපල පිහිටි සථානයේ දී 2006.07.01 වෙනි දින පස්වරු 2.00 ප්‍රසිද්ධ වෙන්දේයේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### උපලේඛනය

කළුකර දිස්ත්‍රික්කයේ, ඌරාගොඩ ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ ඌරාගොඩ ග්‍රාමයේ පිහිටි කහඹිලියකන්ද නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු කේ. කන්නන්ගර විසින් සැකසුණු 1995.09.19 දින හා අංක 601/1995 දරන පිඹුරේ කැබලි අංක 280 ලෙස දැක්වෙන (එකී කැබලි අංක 280 සර්වේයර් ජනරාල්වරයා ) විසින් සහතික කරන ලද අවසන් පිඹුරු අංක 83 හි කැබලි අංක 280 හි නැවත බෙදුමකි) ප්‍රමාණයෙන් අ . 1, රූ. 0, පර්.39ක් වූ බෙදා වෙන් කරන ලද බිම් කොටස සහ ඒ මත පිහිටි සියලුම දේත් සමග වේ. මෙය ඉඩම් කොටස මතුගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක එල් ඩී. ඕ. 36/10 යටතේ ලියාපදිංචි කොට ඇත.

ඩබ්ලිව්. ඩී. මෙන්ඩිස්,
*වැඩ බලන සාමාන්‍යාධිකාරී.*

2006 මැයි මස 19 වැනි දින,
ගාලු පාරේ අංක 269,
කොළඹ 3.

06-111/5

---

## ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව

ණය අංකය : 0100004944.

ණයකරුගේ සම්පූර්ණ නම : මොහම්ඩ් නසාර් මොහමඩ් සාරුක්

(මෙහි මින් මතු "බැංකුව " යනුවෙන් සඳහන් කරනු ලබන) 2003 අංක 15 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනතින් සංශෝධිත 1997 අංක 7 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටවනු ලැබූ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව විසින් යෝජනා සම්මත කරනු ලැබ වර්ෂ 2005.08.19 වැනි දින අංක 1407 දරන ආණ්ඩුවේ *ගැසට් පත්‍රයේ* සහ වර්ෂ 2006.04.10 වැනි දින " ලක්බිම", "ද අයිලන්ඩ්" සහ "තිනක්කුරල්" පුවත්පත්වල පළ කරන ලද නියමය ප්‍රකාර පහත දැක්වෙන මුදල් අයකර ගැනීම පිණිස ( කෙසේ වුවද යෝජනා සම්මුතියෙන් අනතුරුව යම් මුදලක් ගෙවා ඇත්නම් එකී මුදල අඩුකොට ඉතිරි මුදල් අයකර ගැනීම සඳහා ) පහත විස්තර කර තිබෙන දේපළ අංක 134, බැද්දෙගාන පාර, කෝට්ටේ යන ස්ථානයෙහි පදිංචි බලයලත් වෙන්දේසිකරු වන පී. කේ. ඊ. සේනාපති මයා විසින් 2006.06.22 වැනි දින පෙ. ව. 10.30 ට පහත විස්තර කරනු ලබන දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

උකස් බැඳුම්කරය යටතේ රුපියල් එක්ලක්ෂ නවදහස් දෙසිය අනූඅටයි ශත පනස් හයක (රු. 1,09,298.56) මුදලක් වර්ෂ 2004.07.31 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්,

(1) එකී දේපළ උකස මත සංස්ථාවට අයවිය යුතු එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් අනූඑක් දහස් එකසිය පනස්හතරයි ශත හයක (රු. 91,154.06) මුදල ද, 2004.07.31 වන දින දක්වා පොලිය වශයෙන් රුපියල් දහඅට දහස් එකසිය හතළිස් හතරයි ශත පනහක් (රු. 18,144.50) ද වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් එක්ලක්ෂ නවදහස් දෙසිය අනූඅටයි ශත පනස් හයක (රු. 1,09,298.56) ද,

(2) එකී රුපියල් අනූඑක් දහස් එකසිය පනස් හතරයි ශත හයක (රු. 91,154.06) මුදල මත අයවිය යුතු වර්ෂයකට 15% බැගින් වන පොළියක් 2004.08.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා අයකරගැනීම සඳහා ද,

(3) එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතු මුදල් සහ ගාස්තු අයකර ගැනීමට.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, මැද පත්තුවේ, හේවාගම් කෝර්ලේ, හෝමාගම ප්‍රාදේශීය සභා සීමාව තුළ පෝරේගෙදර ග්‍රාමයෙහි පිහිටි දවටගහවත්ත *හෙවත්* හික්ගහවත්ත නමැති ඉඩමට 1998.11.21 දින ඩබ්ලිව්. ඩී. සිරිල් මානක තැන විසින් මැන සම්පාදිත අංක 3593 පිඹුර ප්‍රකාර ලොට් අංක 10බී ට මායිම්, උතුරට : පිඹුරු අංක 3288 හි ලොට් 12 ද ; නැගෙනහිරට : පාර (පිඹුරු අංක 3288 හි ලොට් 15) ද ; දකුණට : පාර ද ; බටහිරට : ලොට් 10 ඒ ද යන මායිම් තුළ පිහිටි පර්චස් දහයයි දශම හතයි පහක (අ. 0, රූ. 0, පර්. 10.75) විශාල ඉඩම මාර්ග පරවශතාවය ද සමග අවිස්සාවේල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එන් 214/171 හි ලියාපදිංචි කර ඇත.

වර්ෂ 2006 ක් වූ මැයි මස 19 වැනි දින කොළඹදීය.

ඉහත නම සඳහන් සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදිය.

සාමාන්‍යාධිකාරී.

06-133

---

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

### 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 53 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකිණීම පිළිබඳ දැන්වීම

ණය අංකය : 6/39340/එච්6/311

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගනු ලැබුවාවූ ද, *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ* 2005.02.18 දින *ගැසට් පත්‍රයේ* සහ 2005.07.04 වැනිදා දිනමිණ පත්‍රයේ පළ කරනු ලැබුවා වූ ද, යෝජනාවකට අනුකූලව, ඉතිරිව ඇති ණය මුදල හා විකිණීමේ දිනය දක්වා අයවිය යුතු පොලිය, වියහියදම් හා යථෝක්ත පනතේ 57 වැනි වගන්තිය යටතේ ආපසු අයකර ගත යුතු මුදල් අයකර ගැනීම

පිණිස, මෙහි පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති දේපළ හා භූමිය, පානදුර, ඩයස් ගොඩනැගිල්ලෙ හි බලයලත් වෙන්දේසිකාර එච්. ගිල්ටන් පෙරේරා විසින් එම එම දේපළ පිහිටි ස්ථානයේ 2006.07.01 වෙනි දින පස්වරු 3.30 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

උපලේඛනය

කළුතර දිස්ත්‍රික්කයේ, කළුතර තොටමුණේ, පයාගල බැද්ද (පයාගල මග්ගොන බැද්ද, උප කාර්යාලය) බේරුවල ප්‍රාදේශීය සභා සීමාවන් තුළ දූවේගොඩ පිහිටි සුදුගහලන්ද නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු එච්. ඒ. ඩී. ප්‍රේමරත්න විසින් සැකසුණු 1999.02.25, 26, 27 සහ මාර්තු 5 දිනයන් සහ අංක 2526 දරන පිඹුරේ කැබලි අංක 69 ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් අ. 0, රූ. 0, පර්. 10 ක් වූ බෙදා වෙන් කරන ලද බිම් කොටස සහ ඒ මත පිහිටි සියලුම දේත් සමඟ වේ. මෙම ඉඩම් කොටස කළුතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක එච්. 230/248, එච්. 228/253 යටතේ ලියාපදිංචි කොට ඇත.

තවද, එකී අංක 2526 දරන පිඹුරේ කැබලි අංක ආර් 1, ආර් 2, ආර් 3, ආර් 4, ආර් 5, ආර් 6, ආර් 7, ආර් 8, සහ ආර් 9 දරන බිම් කොටස් මතින් හිමි මාර්ග අයිතීන් ද සමඟ වේ.

ඩබ්ලිව්. ඩී. මෙන්ඩිස්,
*වැඩබලන සාමාන්‍යාධිකාරී.*

2006 මැයි මස 19 වැනි දින,
ගාලු පාරේ අංක 269,
කොළඹ 3.

06-111/11

---

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

### 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 53 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකිණීම පිළිබඳ දැන්වීම

ණය අංකය : 6/40928/එච්6/624.

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගනු ලැබුවාවූ ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2005.11.03 දින *ගැසට් පත්‍රයේ* සහ 2006.01.09 වැනිදා දිනමිණ පත්‍රයේ පළ කරනු ලැබුවා වූ ද, යෝජනාවකට අනුකූලව, ඉතිරිව ඇති ණය මුදල හා විකිණීමේ දිනය දක්වා අයවිය යුතු පොලිය, වියහියදම් හා යථෝක්ත පනතේ 57 වැනි වගන්තිය යටතේ ආපසු අයකර ගත යුතු මුදල් අයකර ගැනීම පිණිස, මෙහි පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති දේපළ හා භූමිය, පානදුර, ඩයස් ගොඩනැගිල්ලෙ හි බලයලත් වෙන්දේසිකාර එච්. ගිල්ටන් පෙරේරා විසින් එම එම දේපල පිහිටි ස්ථානයේ 2006.07.01 වෙනි දින පස්වරු 4.00ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

උපලේඛනය

කළුතර දිස්ත්‍රික්කයේ, කළුතර තොටමුණේ, පයාගල බැද්ද (පයාගල මග්ගොන බැද්ද උප කාර්යාලය) බේරුවල ප්‍රාදේශීය සභා සීමාවන් තුළ දූවේගොඩ පිහිටි සුදුගහලන්ද නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු එච්. ඒ. ඩී. ප්‍රේමරත්න විසින් සැකසුණු 1999.02.25, 26, 27 සහ මාර්තු 5 දිනයන් සහ අංක 2526 දරන පිඹුරේ කැබලි අංක 151 ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් අ. 0, රූ. 0, පර්. 10 ක් වූ බෙදා වෙන් කරන ලද බිම් කොටස සහ ඒ මත පිහිටි සියලුම දේත් සමඟ වේ. මෙම ඉඩම් කොටස කළුතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක එච්. 230/254, එච්. 228/265 යටතේ ලියාපදිංචි කොට ඇත.

තවද, එකී අංක 2526 දරන පිඹුරේ කැබලි අංක ආර් 1, ආර් 2, ආර්. 3, ආර් 4, ආර් 5, ආර් 6, ආර් 7, ආර් 8, සහ ආර් 9 දරන බිම් කොටස් මතින් හිමි මාර්ග අයිතීන් ද සමඟ වේ.

ඩබ්ලිව්. ඩී. මෙන්ඩිස්,
*වැඩබලන සාමාන්‍යාධිකාරී.*

2006 මැයි මස 19 වැනි දින,
ගාලු පාරේ, අංක 269,
කොළඹ 3.

06-111/10

---

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

### 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 53 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකිණීම පිළිබඳ දැන්වීම

ණය අංකය : 6/38244/එල්6/738.

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගනු ලැබුවාවූ ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2004.04.08 දින *ගැසට් පත්‍රයේ* සහ 2005.08.08 වැනිදා දිනමිණ පත්‍රයේ පළ කරනු ලැබුවා වූ ද, යෝජනාවකට අනුකූලව, ඉතිරිව ඇති ණය මුදල හා විකිණීමේ දිනය දක්වා අයවිය යුතු පොලිය, වියහියදම් හා යථෝක්ත පනතේ 57 වැනි වගන්තිය යටතේ ආපසු අයකර ගත යුතු මුදල් අයකර ගැනීම පිණිස, මෙහි පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති දේපළ හා භූමිය, පානදුර, ඩයස් ගොඩනැගිල්ලෙ හි බලයලත් වෙන්දේසිකාර එච්. ගිල්ටන් පෙරේරා විසින් එම එම දේපළ පිහිටි ස්ථානයේ 2006.07.01 වෙනි දින පෙරවරු 10.30ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

උපලේඛනය

කළුතර දිස්ත්‍රික්කයේ, කළුතර තොටමුණ උතුර, (කළුතර බැද්ද උප කාර්යාලය) කළුතර ප්‍රාදේශීය සභා සීමාවන් තුළ පලාතොට පිහිටි පන්විලකැලේ හෙවත් වින්සන්ට් ගෘප් නමැති ඉඩමේ කොටසක් (දැන් තිල්කෙත නමින් හැඳින්වෙන ) නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු එම්.එම්. ඩී. කුරේ විසින් සැකසුණු 1998.04.18 දින හා අංක 368 දරන පිඹුරේ කැබලි අංක 2 ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් අ. 0, රූ 0, පර්. 12.9ක් වූ බෙදා වෙන් කරන ලද බිම් කොටස සහ ඒ මත පිහිටි සියලුම දේත් සමඟ වේ. මෙම ඉඩම් කොටස කළුතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක ජී 185/174 යටතේ ලියාපදිංචි කොට ඇත.

තවද, එකී අංක 368 දරන පිඹුරේ කැබලි අංක 56 මතින් ඇති මාර්ග අයිතිය සහ එකී පිඹුරේම (පාරවල් සඳහා වෙන් කරන ලද බිම් කොටස් ) මතින් ඇති මාර්ග අයිතීන් සහ අනෙකුත් සියලුම අයිතීන් ද සමඟ වේ.

ඩබ්ලිව්. ඩී. මෙන්ඩිස්,
*වැඩබලන සාමාන්‍යාධිකාරී.*

2006 මැයි මස 19 වැනි දින,
ගාලු පාරේ, අංක 269,
කොළඹ 3.

06-111/9

---

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

### 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 53 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකිණීම පිළිබඳ දැන්වීම

ණය අංක : 6/44236/එච්6/672 - 6/44237/එච්6/673.

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගනු ලැබුවාවූ ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2004.01.02 දින *ගැසට් පත්‍රයේ* සහ 2005.04.12 වැනිදා දිනමිණ පත්‍රයේ පළ කරනු ලැබුවා වූ ද, යෝජනාවකට අනුකූලව, ඉතිරිව ඇති ණය මුදල හා විකිණීමේ දිනය දක්වා අයවිය යුතු පොලිය, වියහියදම් හා යථෝක්ත පනතේ 57 වැනි වගන්තිය යටතේ ආපසු අයකර ගත යුතු මුදල් අයකර ගැනීම පිණිස, මෙහි පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති දේපළ හා භූමිය, පානදුර, ඩයස් ගොඩනැගිල්ලෙ හි බලයලත් වෙන්දේසිකාර එච්. ගිල්ටන් පෙරේරා විසින් එම එම දේපළ පිහිටි ස්ථානයේ 2006.07.01 වෙනි දින පෙරවරු 9.00ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

#### උපලේඛනය

කළුතර දිස්ත්‍රික්කයේ, කළුතර තොටමුණ උතුර, දොඩම්ගොඩ ප්‍රාදේශීය සභා සීමාවන් තුළ, බෝම්බුවල ග්‍රාමයේ පිහිටි බටකුලුකට්ටියලන්ද *හෙවත්* මුත්තෙට්ටුහේන වඩාත් නිවැරදිව මුත්තෙට්ටුහේන (අක්කර 8) නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු අයි. ටී. මාදොල විසින් සැකසුණු 1997.09.28 දින හා අංක 97/47 දරන පිඹුරේ කැබලි අංක 26 ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් අ. 0, රූ. 0, පර්. 10.60ක් වූ බෙදා වෙන් කරන ලද බිම් කොටස සහ ඒ මත පිහිටි සියලුම දේත් සමඟ වේ. මෙම ඉඩම් කොටස කළුතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක පී 166/17 යටතේ ලියාපදිංචි කොට ඇත.

තවද, එකී පිඹුරේ දැක්වෙන මාර්ග අයිතීන් ද සමඟ වේ.

ඩබ්ලිව්. ඩී. මෙන්ඩිස්,
*වැඩබලන සාමාන්‍යාධිකාරී.*

2006 මැයි මස 19 වැනි දින,
ගාලු පාරේ අංක 269,
කොළඹ 3.

06-111/4

---

## ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව

ණය අංකය : 0100005422.

ණයකරුගේ සම්පූර්ණ නම : දිසානායක විනිතා හේමමාලි එදිරිසිංහ සහ එදිරිසිංහ ආරච්චිගේ චන්ද්‍ර කුමාර එදිරිසිංහ

(මෙහි මින් මතු "බැංකුව" යනුවෙන් සඳහන් කරනු ලබන) 2003 අංක 15 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනතින් සංශෝධිත 1997 අංක 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටවනු ලැබූ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව බැංකුව විසින් යෝජනා සම්මත කරනු ලැබ වර්ෂ 2005.08.19 වැනි දින අංක 1, 407 දරන ආණ්ඩුවේ *ගැසට් පත්‍රයේ* සහ වර්ෂ 2006.04.10 වැනි දින " ලක්බිම", "ද අයිලන්ඩ්" සහ "තිනක්කුරල්" පුවත්පත්වල පළ කරන ලද නියමය ප්‍රකාර පහත දැක්වෙන මුදල් අයකර ගැනීම පිණිස කෙසේ වුවද යෝජනා සම්මුතියෙන් අනතුරුව යම් මුදලක් ගෙවා ඇත්නම් එකී මුදල් අඩුකොට ඉතිරි මුදල් අයකර ගැනීම සඳහා පහත විස්තර කර තිබෙන දේපළ අංක 228/ඒ, වලව්වත්ත, කැස්බෑව ස්ථානයෙහි පදිංචි බලයලත් වෙන්දේසිකරු වන ඒ. එස්. ලියනගේ මයා විසින් 2006.06.21 වැනි දින පෙ. ව. 11.00 සිට පහත විස්තර කරනු ලබන දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

උකස් බැඳුම්කරය යටතේ රුපියල් නවලක්ෂ හාරදහස් හාරසිය තිස්අටයි ශත හැත්තෑ නවයක (රු. 9,04,438.79) මුදලක් වර්ෂ 2003.11.30 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්,

(1) එකී දේපළ උකස මත සංස්ථාවට අයවිය යුතු එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් හත්ලක්ෂ අසූදහස් හත්සිය අනූඑකයි ශත අටක (රු. 7,80,791.08) මුදල ද, 2003.11.30 වන දින දක්වා පොලිය වශයෙන් රුපියල් එක්ලක්ෂ විසිතුන් දහස් හයසිය හතළිස් හතයි ශත හැත්තෑ එකක් (රු. 1,23,647.71) ද වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් නවලක්ෂ හාරදහස් හාරසිය තිස්අටයි ශත හැත්තෑ නවයක් (රු. 9,04,438.79) ද,

(2) එකී රුපියල් හත්ලක්ෂ අසූදහස් හත්සිය අනූඑකයි ශත අටක (රු. 7,80,791.08) මුදල මත අයවිය යුතු වර්ෂයකට 16% බැගින් වන පොලියක් 2003.12.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා අයකරගැනීම සඳහා ද,

(3) එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතු මුදල් සහ ගාස්තු අයකර ගැනීමට.

#### උපලේඛනය

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, පානදුර තල්පිටි දෙබැද්දේ බණ්ඩාරගම ප්‍රාදේශීය සභා සීමාවේ, කළුදේවාල ග්‍රාමයෙ හි පිහිටි මුනමල්ගහවත්ත නමැති ඉඩමට 1986.03.29 දින එල්. ඩබ්. එල්. ද සිල්වා මානක තැන විසින් මැන සම්පාදිත අංක 5333 පිඹුර ප්‍රකාර ලොට් 02 ට මායිම්, උතුරට : නල්ලූරුව සිට මහවිල දක්වා දිවෙන පාර ද ; නැගෙනහිරට: පාර ද ; දකුණට : ලොට් 3 ද ; බටහිරට : ලොට් 01 ද යන මායිම් තුළ පිහිටි පර්චස් විසිපහයි දශම පහක් (අ. 0, රූ. 0, පර්. 25.5) වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් සියළුදේද, මාර්ග පරවශතාවය ද සමග පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එෆ්. 387/25 හි ලියාපදිංචි කර ඇත.

වර්ෂ 2006 ක් වූ මැයි මස 19 වැනි දින කොළඹ දී ය.

ඉහත නම සඳහන් සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදිය.

සාමාන්‍යාධිකාරී.

06-137

## ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව

ණය අංකය : 0300001633.

ණයකරුගේ සම්පූර්ණ නම : ප්‍රැන්සිස්කු දුරගේ ප්‍රේමලාල් ජයතලක සහ සමරවීර මුදලිගේ දෝන සජීවනී ප්‍රියංකා.

(මෙහි මින් මතු "බැංකුව" යනුවෙන් සඳහන් කරනු ලබන) 2003 අංක 15 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනතින් සංශෝධිත 1997 අංක 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටවනු ලැබූ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව විසින් යෝජනා සම්මත කරනු ලැබ වර්ෂ 2003.11.21 වැනි දින අංක 1,316 දරන ආණ්ඩුවේ *ගැසට් පත්‍රයේ* සහ වර්ෂ 2006.04.28 වැනි දින " ලක්බිම", "ද අයිලන්ඩ්" සහ "තිනක්කුරල්" පුවත්පත්වල පළ කරන ලද නියමය ප්‍රකාර පහත දැක්වෙන මුදල් අයකර ගැනීම පිණිස කෙසේ වුවද යෝජනා සම්මතයෙන් අනතුරුව යම් මුදලක් ගෙවා ඇත්නම් එකී මුදල අඩුකොට ඉතිරි මුදල් අයකර ගැනීම සඳහා පහත විස්තර කර තිබෙන දේපළ අංක 228/ඒ, වලව්වත්ත, කැස්බෑව ස්ථානයෙහි පදිංචි බලයලත් වෙන්දේසිකරු වන ඒ. එස්. ලියනගේ මයා විසින් 2006.06.20 වැනි දින පෙ. ව. 11.00 ට පහත විස්තර කරනු ලබන දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

උකස් බැඳුම්කරය යටතේ රුපියල් දෙලක්ෂ තිස්දහස් දෙසිය විසිහතරයි ශත අනූහයක (රු. 2,30,224.96) මුදලක් වර්ෂ 2003.02.28 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්,

(1) එකී දේපළ උකස මත බැංකුවට අයවිය යුතු එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් එක්ලක්ෂ අසූඑක්දහස් විසිහයයි ශත දහඅටක (රු. 1,81,026.18) මුදල ද, 2003.02.28 වන දින දක්වා පොලිය වශයෙන් රුපියල් හතලිස් නව දහස් එකසිය අනූඅටයි ශත හැත්තෑ අටක් (රු. 49,198.78) ද වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් දෙලක්ෂ තිස්දහස් දෙසිය විසිහතරයි ශත අනූහයක් (රු. 2,30,224.96) ද,

(2) එකී රුපියල් එක්ලක්ෂ අසූඑක්දහස් විසිහයයි ශත දහඅටක (රු. 1,81,026.18) මුදල මත අයවිය යුතු වර්ෂයකට 15% බැගින් වන පොලියක් 2003.03.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා අයකර ගැනීම සඳහා ද,

(3) එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතු මුදල් සහ ගාස්තු අයකර ගැනීම පිණිස.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, බටහිර පස්දුන් කෝරළේ ඉද්දගොඩ පත්තුවේ, දොඩන්ගොඩ ග්‍රාමයේ පිහිටි සපුගහවත්ත කුරුඳුවත්ත *හෙවත්* සපුගවත්ත බිම්කැටිය හි කැබලි අංක 04 නමැති ඉඩමට 1998.10.06 දින ටී. සමරනායක මානක තැන විසින් මැන සම්පාදිත අංක 63 පිඹුර ප්‍රකාර ලොට් 03 ට මායිම්, උතුරට : අංක 2120 දරන පිඹුරේ දැක්වෙන කැබලි අංක 01 ද ; නැගෙනහිරට : කැබලි අංක 04 ද ; දකුණට : කැබලි අංක 06 ද ; බටහිරට : කැබලි අංක 02 ද යන මායිම් තුළ පිහිටි පර්චස් අටක් (අ. 0, රූ. 0, පර්. 8) වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් සියළුදේද, මාර්ග පරවශතාවය ද සමග මතුගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී. 334/240 හි ලියාපදිංචි කර ඇත.

වර්ෂ 2006 ක් වූ මැයි මස 19 වැනි දින කොළඹ දී ය.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි ය.

සාමාන්‍යාධිකාරි.

06-138

## ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව

ණය අංකය : 2400000652.

ණයකරුගේ සම්පූර්ණ නම : පෙරමුණේ ගමඇතිගේ ගාමිණී

(මෙහි මින් මතු "බැංකුව" යනුවෙන් සඳහන් කරනු ලබන) 2003 අංක 15 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනතින් සංශෝධිත 1997 අංක 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටවනු ලැබූ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව විසින් යෝජනා සම්මත කරනු ලැබ වර්ෂ 2004.06.11 වැනි දින අංක 1,345 දරන ආණ්ඩුවේ *ගැසට් පත්‍රයේ* සහ වර්ෂ 2006.04.21 වැනි දින " ලක්බිම", "ද අයිලන්ඩ්" සහ "තිනක්කුරල්" පුවත්පත්වල පළ කරන ලද නියමය ප්‍රකාර පහත දැක්වෙන මුදල් අයකර ගැනීම පිණිස කෙසේ වුවද යෝජනා සම්මතයෙන් අනතුරුව යම් මුදලක් ගෙවා ඇත්නම් එකී මුදල අඩුකොට ඉතිරි මුදල් අයකර ගැනීම සඳහා පහත විස්තර කර තිබෙන දේපළ අංක 134, බැද්දේගාන පාර, කෝට්ටේ හි පදිංචි බලයලත් වෙන්දේසිකරු වන පී. කේ. ඊ. සේනාපති මයා විසින් 2006.06.21 වැනි දින පෙ. ව. 11.00 සිට පහත විස්තර කරනු ලබන දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

උකස් බැඳුම්කරය යටතේ රුපියල් හැත්තෑ අටදහස් තුන්සියයයි ශත එකක (රු. 78,300.01) මුදලක් වර්ෂ 2003.09.30 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්,

(1) එකී දේපළ උකස මත සංස්ථාවට අයවිය යුතු එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් පනස් දහස් හාරසිය හැටතුනයි ශත තිස්හතරක (රු. 50,463.34) මුදල ද, 2003.09.30 වන දින දක්වා පොලිය වශයෙන් රුපියල් විසිහත් දහස් අටසිය තිස්හයයි ශත හැටහතක් (රු. 27,836.67) ද වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් හැත්තෑ අටදහස් තුන්සියයි ශත එකක් (රු. 78,300.01)

(2) එකී රුපියල් පනස් දහස් හාරසිය හැටතුනයි ශත තිස්හතරක (රු. 50,463.34) මුදල මත අයවිය යුතු වර්ෂයකට 15.50% බැගින් වන පොලියක් 2003.10.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා අයකර ගැනීම සඳහා ද,

(3) එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතු මුදල් සහ ගාස්තු අයකර ගැනීමට.

### උපලේඛනය

සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, පන්නිල් පත්තුවේ, අටකලන් කෝරළේ, කහවත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, යායින්න ග්‍රාමයෙහි පිහිටි යායින්න අක්කර අසූව නමැති ඉඩමට 1997.12.01 සිට 1997.12.31 දින කේ. ඒ. කේ. එදිරිසිංහ මානක තැන විසින් මැන සම්පාදිත අංක 667 පිඹුර ප්‍රකාර ලොට් 13 ට මායිම්, උතුරට : කැබලි අංක 09 ද ; නැගෙනහිරට : කැබලි අංක 12 ද ; දකුණට : පාර ද ; බටහිරට : කැබලි අංක 14 ද යන මායිම් තුළ පිහිටි පර්චස් විස්සයි දශම හතක (අ. 0, රූඩ් 0, පර්. 20.7) වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් සියළුදේද, මාර්ග පරවශතාවය ද සමග රත්නපුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එෆ්. 344/08 හි ලියාපදිංචි කර ඇත.

වර්ෂ 2006 ක් වූ මැයි මස 19 වැනි දින කොළඹ දී ය.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදිය.

සාමාන්‍යාධිකාරි.

06-139

## ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව

ණය අංකය : 0100006740/0100006689.

ණයකරුගේ නම.– නාමල්ගම මුදියන්සේලාගේ ආනන්ද සරත් නාමල්ගම.

(මෙහි මින් මතු "බැංකුව" යනුවෙන් සඳහන් කරනු ලබන) 2003 අංක 15 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනතින් සංශෝධිත 1997 අංක 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටවනු ලැබූ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව විසින් යෝජනා සම්මත කරනු ලැබ වර්ෂ 2006.04.21 වැනි දින අංක 1440 දරන ආණ්ඩුවේ *ගැසට් පත්‍රයේ* සහ වර්ෂ 2006.04.21 වැනි දින " ලක්බිම", "ද අයිලන්ඩ්" සහ "තිනක්කුරල්" පුවත්පත්වල පළ කරන ලද නියමය ප්‍රකාර පහත දැක්වෙන මුදල් අයකර ගැනීම පිණිස කෙසේ වුවද, යෝජනා සම්මුතියෙන් අනතුරුව යම් මුදලින් ගෙවා ඇත්නම් එකී මුදල අඩුකොට ඉතිරි මුදල් අයක ගැනීම සඳහා පහත විස්තර කර තිබෙන දේපළ අංක 228/ඒ, වලව්වත්ත, කැස්බෑව හි පදිංචි බලයලත් වෙන්දේසිකරු වන ඒ. එස්. ලියනගේ විසින් 2002.06.20 වැනි දින ප. ව. 2.00 සිට පහත විස්තර කරනු ලබන දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

උකස් බැඳුම්කරය යටතේ රුපියල් තිස්ලක්ෂ අනූඅට දහස් පනස්දෙකක (රු. 30,98,052) මුදලක් වර්ෂ 2005.12.31 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්,

(1) එකී දේපළ උකස මත සංස්ථාවට අයවිය යුතු එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් විසිහත් ලක්ෂ හැටතුන් දහස් එකසිය නවයයි ශත හැත්තෑ හතරක (රු. 27,63,109.74) මුදල ද, 2005.12.31 වැනි දින දක්වා පොලිය වශයෙන් රුපියල් තුන්ලක්ෂ තිස්හතරදහස් නවසිය හතළිස් දෙකයි ශත විසිහයක් (රු. 3,34,942.26) ද වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් තිස්ලක්ෂ අනූඅටදහස් පනස්දෙකක (රු. 30,98,052),

(2) එකී රුපියල් විසිහත් ලක්ෂ හැටතුන් දහස් එකසිය නවයයි ශත හැත්තෑ හතරක (රු. 27,63,109.74) මුදල මත අයවිය යුතු වර්ෂයකට 12.50% බැගින් වන පොලියක් 2006.01.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා අයකරගැනීම සඳහා ද,

(3) එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතු මුදල් සහ ගාස්තු අයකර ගැනීමට.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, පානදුර තොටමුණේ, තල්පිටිදෙබද්දෙහි පානදුර ප්‍රාදේශීය සභා සීමාවේ, මාලමුල්ල ග්‍රාමයෙහි පිහිටි මානමුල්ල නැමැති ඉඩමට 2001.03.18 දින පී. ඒ. කේ. ජේ. පෙරේරා මානක තැන විසින් මැන සම්පාදිත අංක 3217 පිඹුර ප්‍රකාර ලොට් 18 ට මායිම්, උතුරට : ලොට් 15 ද, නැගෙනහිරට : ලොට් 5 ද, දකුණට : ලොට් 19 සහ බටහිරට : ලොට්16 සහ 17 ද, යන මායිම් තුළ පිහිටි පර්චස් නවයක (අ. 0, රූඩ් 0, පර්. 9) වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් සියළුදේද, මාර්ග පරවශතාවය ද සමග පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එෆ්. 452/88 හි ලියාපදිංචි කරඇත.

තවද, ඉහත කී මාලමුල්ල ග්‍රාමයෙහි පිහිටි මානමුල්ල නමැති ඉඩමට 2001.03.18 දින පී. ඒ. කේ. ජේ. පෙරේරා මානක තැන විසින් මැන සම්පාදිත අංක 3217 පිඹුර ප්‍රකාර ලොට් 19 ට මායිම්, උතුරට : ලොට් 18 ද, නැගෙනහිරට : ලොට් 5 ද ; දකුණට : ලොට් 31 ද ; බටහිර : ලොට් 17 සහ 20 ද යන මායිම් තුළ පිහිටි පර්චස් නමයක (අ. 0, රූඩ් 0, පර්. 9) වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් සියළුදේ ද, මාර්ග පරවශතාවය ද සමග පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එෆ් 452/89 හි ලියාපදිංචි කර ඇත.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදිය.

වර්ෂ 2006 ක් වූ මැයි මස 19 වැනි දින කොළඹ දී ය.

සාමාන්‍යාධිකාරී.

06-134

---

## ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව

ණය අංකය : 1800000941.

ණයකරුගේ සම්පූර්ණ නම : කරුණාතිලකගේ නිමල් වීරසූරිය

(මෙහි මින් මතු "බැංකුව" යනුවෙන් සඳහන් කරනු ලබන)2003 අංක 15 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනතින් සංශෝධිත 1997 අංක 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටවනු ලැබූ, ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව විසින් යෝජනා සම්මත කරනු ලැබ වර්ෂ 2005.12.23 වැනි දින අංක 1425 දරන ආණ්ඩුවේ *ගැසට් පත්‍රයේ* සහ වර්ෂ 2006.04.08 වැනි දින ලක්බිම, ද අයිලන්ඩ්, තිනක්කුරල් පුවත්පත් වල පළ කරන ලද නියමය ප්‍රකාර පහත දැක්වෙන මුදල් අයකරගැනීම පිණිස (කෙසේ වුව ද යෝජනා සම්මුතියෙන් අනතුරුව යම් මුදලක් වො ඇත්නම් එකී මුදල අඩුකොට ඉතිරි මුදල් අයකර ගැනීම සඳහා) පහත විස්තර කර තිබෙන දේපළ අංක 28, නව කාර්යාල සංකීර්ණය, කුමාරතුංග මාවත, කුරුණෑගල හි පදිංචි බලයලත් වෙන්දේසිකරු වන ඩබ්. එම්. අයි. ගල්ලෑල්ල මයා විසින් 2006.06.23 වැනි දින පෙ. ව. 10.30 සිට පහත විස්තර කරනු ලබන දේපළ පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

උකස් බැඳුම්කරය යටතේ රුපියල් එක්ලක්ෂ හතළිස්තුන්දහස් හත්සිය අනූදෙකයි ශත අසූහයක (රු.1, 43,792.86) මුදලක් වර්ෂ 2003.07.31 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්,

(1) එකී දේපළ උකස මත සංස්ථාවට අයවිය යුතු එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් එක්ලක්ෂ විසිඑක් දහස් එකසිය විසිතුනයි ශත අසූහතරක (රු. 1,21,123.84) මුදල ද, 2003.07.31 වැනි දින දක්වා පොලිය වශයෙන් රුපියල් විසිදෙදහස් හයසිය හැටනවයයි ශත දෙකක් (රු. 22,669.02) ද වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් එක්ලක්ෂ හතලිස්තුන් දහස් හත්සිය අනූදෙකයි ශත අසූහයක (රු. 1,43,792.86) ද,

(2) එකී රුපියල් එක්ලක්ෂ විසිඑක් දහස් එකසිය විසිතුනයි ශත අසූහතරක (රු. 1,21,123.84) මුදල මත අයවිය යුතු වර්ෂයකට 13.50% බැගින් වන පොලියක් 2003.08.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා අයකරගැනීම සඳහා ද,

(3) එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතු මුදල් සහ ගාස්තු අයකර ගැනීමට.

උපලේඛනය

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, හිරියාල හත්පත්තුවේ, මහගල්බොඩ එගොඩ කෝරළේ, ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාවේ, ගලගෙදර ග්‍රාමයෙහි පිහිටි කජුගහමුලවත්ත නැමැති ඉඩමට 1999.11.12 දින ජී. බී. දිසානායක මානක තැන විසින් සම්පාදිත අංක 1321 පිඹුර ප්‍රකාර ලොට් 01 ඒ 1 ට මායිම්, උතුරට : මාර්ග රක්ෂිතය, නැගෙනහිරට : අංක 1321 පිඹුරේ ලොට් 02, දකුණට : ලොට් 01 ඒ 2, බටහිරට : ගම්සභා පාර යන මායිම් තුළ පිහිටි රුඩ් දෙකක (අ. 0, රූ. 2, පර්. 0) වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් සියළුදේද, මාර්ග පරවශතාවය ද සමග කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ බී. 755/213 හි ලියාපදිංචි කරඇත.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදිය.

වර්ෂ 2006 ක් වූ මැයි මස 19 වැනි දින කොළඹ දී ය.

සාමාන්‍යාධිකාරී.

06-135

---

## ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව

ණය අංකය : 0105500215.

ණයකරුගේ සම්පූර්ණ නම : ඒකනායක රාජපක්ෂ කොඩිප්පිලි දිසානායක මුදියන්සේ රාළහාමිලාගේ රවීන්ද්‍ර කුමාරනාත් දෙහෙරගොඩ

(මෙහි මින් මතු "බැංකුව" යනුවෙන් සඳහන් කරනු ලබන) 2003 අංක 15 දරණ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනතින් සංශෝධිත 1997 අංක 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටවනු ලැබූ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව විසින් යෝජනා සම්මත කරනු ලැබ වර්ෂ 2005.11.25 වැනි දින අංක 1421 දරන ආණ්ඩුවේ *ගැසට් පත්‍රයේ* සහ වර්ෂ 2006.04.10 වැනි දින " ලක්බිම", "ද අයිලන්ඩ්" සහ "තිනක්කුරල්" පුවත්පත්වල පළ කරන ලද නියමය ප්‍රකාර පහත දැක්වෙන මුදල් අයකර ගැනීම පිණිස (කෙසේ වුවද යෝජනා සම්මුතියෙන් අනතුරුව යම් මුදලක් ගෙවා ඇත්නම් එකී මුදල අඩුකොට ඉතිරි මුදල් අයකර ගැනීම සඳහා පහත විස්තර කර තිබෙන දේපළ අංක 134, බැද්දේගාන, කෝට්ටේ ස්ථානයෙහි පදිංචි බලයලත් වෙන්දේසිකරු වන පී. කේ. ඊ. සේනාපති මයා විසින් 2006.06.22 වැනි දින පෙ. ව. 11.30 සිට පහත විස්තර කරනු ලබන දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

උකස් බැඳුම්කරය යටතේ රුපියල් තුන්ලක්ෂ විසිහතර දහස් හයසිය අනූවයි ශත විසිහතක (රු. 3,24,690.27) මුදලක් වර්ෂ 2005.05.31 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්,

(1) එකී දේපළ උකස මත සංස්ථාවට අයවිය යුතු එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් දෙලක්ෂ අනූ දෙදහස් දෙසිය දහඅටයි ශතඅනූවක (රු. 2,92,218.90) මුදල ද, 2005.05.31 වැනි දින දක්වා පොළිය වශයෙන් රුපියල් තිස්දෙදහස් හාරසිය හැටඑකයි ශත තිස්හතක් (රු. 32,461.37) ද වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් තුන්ලක්ෂ විසිහතර දහස් හයසිය අසූවයි ශත විසිහතක (රු. 3,24,680.27).

(2) එකී රුපියල් දෙලක්ෂ අනූදෙදහස් දෙසිය දහඅටයි ශත අනූවක (රු. 2,92,218.90) මුදල මත අයවිය යුතු වර්ෂයකට 9.50% බැගින් වන පොළියක් 2005.06.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා අයකරගැනීම සඳහා ද,

(3) එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතු මුදල් සහ ගාස්තු අයකර ගැනීමට.

උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලෙ පත්තුවේ, කඩුවෙල ප්‍රාදේශීය සභා සීමාවේ, හෝකන්දර ග්‍රාමයෙහි පිහිටි දියපරගහවත්ත නැමැති ඉඩමට 2002.09.2 දින ආර්. දන්තනාරායන මානක තැන විසින් මැන සම්පාදිත අංක 306 පිඹුර ප්‍රකාර ලොට් 1 ට මායිම්, උතුරට : පාර පිඹුරු අංක 10385ඒ හි කැබලි අංක 148 ද, නැගෙනහිරට : පිඹුරු අංක 1085ඒ හි කැබලි අංක 41 ද, දකුණට : පිඹුරු අංක 10385ඒ හි කැබලි අංක 29 ද, බටහිරට : කැබලි අංක 39 යන මායිම් තුළ පිහිටි පර්චස් දහයයි දශම එකක (අ. 0, රූඩ් 0, පර්. 10.1) වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් සියළුදේද, මාර්ග පරවශතාවය ද සමග හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ **G** 1400/68 හි ලියාපදිංචි කර ඇත.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදිය.

වර්ෂ 2006 ක් වූ මැයි මස 19 වැනි දින කොළඹදීය.

සාමාන්‍යාධිකාරී.

06-136

---

## සීමාසහිත සම්පත් බැංකුව

### 1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය යටතේ විකිණීම

වැද්දාගල තේ කර්මාන්තශාලාව *නොහොත්* වැද්දාගල ටී ෆැක්ටරි ගිණුම් අංකය : 0041 2000 0212 සහ 0029 1000 2093.

1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2005.02.22 වන දින යෝජනා කොට සම්මත කරගනු ලැබ 2005.07.29 වන දින රජයේ *ගැසට් පත්‍රයේ* සහ 2005.07.22 වන දින "දිවයින", "අයිලන්ඩ්" සහ "තිනකුරල්" යන දිනපතා පුවත් පත් වලද පළ කරන ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් තුන් කෝටි අනූඅට ලක්ෂ දෙදහසක (රු.39,802,000) මුදල සමග තවත් රුපියල් තුන්කෝටි දසලක්ෂ විසිපන් දහසක (රු. 31,025,000) මුදල සඳහා වසරකට සියයට පහලොව (15%) බැගින්ද, තවත් රුපියල් පනස් ලක්ෂයක (රු.5,000,000) මුදල සඳහා වසරකට සියයට දහනවයයි දශම පහ (19.5%) බැගින්ද, 2004 දෙසැම්බර් 21 වැනිදා සිට වෙන්දේසි දින තෙක් තවදුරටත් පොලී මුදලද සමග ප්‍රචාරක වියදම් හා වෙනත් අයකිරීම් වෙතොත් ඒවාද සමග එතෙක් ගෙවී ඇති යම් මුදලක් (වේ නම්) අඩුකොට අයකර ගැනීම සඳහා මෙහි පහත උපලේඛනයේ වඩාත් මැනැවින් විස්තර කොට ඇති දේපල හා පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකරු ෂොක්මන් සහ සමරවික්‍රම විසින් 2006.07.04 දින පෙ. ව. 11.00 ට පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### උපලේඛනය

සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, කුකුල් කෝරලේ, උඩ පත්තුවේ ගන්ගාලගමුව ග්‍රාමයේ පිහිටි බලයලත් මිනින්දෝරු එල්. යූ. කන්නන්ගර විසින් සාදන ලද 1987 අගෝස්තු 6 දාතම හා අංක 2741 දරන පිඹුරේ නිරූපිත ඉඩමේ කොටසක් වන) ගන්ගාලගමුව එස්ටේට් සහ ගමඉරිගුලානේ හේන නැමැති ඉඩමෙන් බලයලත් මිනින්දෝරු එස්. රාමක්‍රිෂ්ණන් විසින් සාදන ලද 2002 නොවැම්බර් 25 සහ 26 දාතම හා අංක 10166 දරන පිඹුරේ නිරූපිත ලොට් 1111 ලෙස ලකුණු කොට දක්වා ඇති එකී අංක 10166 පිඹුරට අනුව, උතුරට: V. P. 948 හි ලොට් 1107 ද, නැගෙනහිරට: ලොට් 1126 ද දකුණට: ලොට් 209 සහ 1126 ද සහ බටහිරට: පාරද මායිම්වන ප්‍රමාණයෙන් අක්කර දොලහයි රූඩ් තුනයි පර්චස් තිස් එකක් (අක් 12, රූඩ් 3, පර්. 31) වන බෙදා වෙන්කොට සීමා නිර්නය කළ ඉඩම එහි ඇති පස, ගහකොල, වගාවන්, ගොඩනැගිලි සහ අනෙකුත් සියළුම දේ සමග. ඉහත කී ලොට් 1111 පහත විස්තර කෙරෙන ඉඩමේ ප්‍රති මිනුමකි.

ඉහත කී ගන්ගාලගමුව ග්‍රාමයේ පිහිටි ගන්ගාලගමුව එස්ටේට් නැමැති ඉඩමේ B. S. V. P. 948 හි ලොට් 1111 ලෙස ලකුණු කොට දක්වා ඇති, උතුරට: ලොට් 1107 ද, නැගෙනහිරට: ලොට් 1126, 2/2 ද, දකුණට: ලොට් 208 සහ ලොට් 209 ද සහ බටහිරට: ලොට් 1100 ද මායිම් වන ප්‍රමාණයෙන් අක්කර දොලහයි රූඩ් තුනයි පර්චස් තිස්එකක් (අක් 12, රූඩ් 3, පර්. 31) වන සම්පූර්ණ ඉඩම, රත්නපුර ඉඩම් කාර්යාලයේ C191/231 හි ලියාපදිංචි කොට ඇති එකී අංක B. S. V. P. 948 පිඹුරට අනුවය.

තවද එහි ස්ථාපනය කොට ඇති පහත විස්තර කෙරෙන යන්ත්‍රසූත්‍ර ද සමගය.

| *යන්ත්‍ර සූත්‍ර* | *ප්‍රමාණය* | *අනු අංකය* |
|---|---|---|
| ප්‍රධාන කොටස - බිම් මහල | | |
| රෝලින් කාමරය | | |
| වෝකර්ස් ටී රෝලර් 47″ මෝටරය හා ස්ටාටරය සමග | 06 | W/R535,W/R536 W/R730,W/R720, W R728 |
| C. C. C. ටී. රෝලර් 47″ මෝටරය හා ස්ටාටරය සමග | 02 | HDT4865 HDT4864 |
| වෝකර් රොස් බ්‍රේකර් 12″ x 4 1/2″ මෝටරය හා ස්ටාටරය සමග | 04 | GL2008, GL2003 GL2009, GL2010 |
| හියුම්ඩිෆයර්ස් මෝටරය හා ස්ටාටරය සමග | 02 | |
| මේන් ස්විච් බෝඩ් 400 ඒඑම්පී | 01 | |
| ඩ්‍රයින් කාමරය | | |
| බ්‍රවුන් 6′ ඩ්‍රයරය සින්ගල් ස්ටේජ් | 01 | BG/DR/1993/05 |
| බ්‍රවුන් 5′ ඩ්‍රයරය සින්ගල් ස්ටේජ් | 01 | BG/DR1993/04 |
| සිරොක් 4′ ඩ්‍රයරය සින්ගල් ස්ටේජ් | 01 | 3846GL |
| ෆර්නස් ඔයිල් බර්නර් | 01 | |
| ෆර්නස් ඔයිල් ටැංකි ගැලුම් 300 | 01 | |
| සිෆ්ටින් කාමරය | | |
| ෆීඩ් කන්වි හෝ/සහ සයික්ලොන් සමග සක්ෂන් විනෝවර් | 03 | 996-99–112-20 |
| මිච් සිෆ්ටර් මෝටරය හා ස්ටාටරය සමහ | 07 | 800MTS, 799MTS 798MTS, 99 -M-1 99-M-2, 99-M- 7 |
| වෝටා සිෆ්ටර් මෝටරය හා ස්ටාටරය සමග | 02 | MTS-148 ii MTS -149 ii |
| 3T ස්ටොක් එක්ස්ට්‍රැක්ටර් | 01 | 91G-17-312 |
| ෆයිබර් එක්ස්ට්‍රැක්ටර් මෝටරය හා ස්ටාටරය සමග | | PE- 14-99-2000 |
| විඩ්ල්ටන් එක්ස්ට්‍රැක්ටර්ස් මෝටරය හා ස්ටාටරය සමග | 03 | BG/MY/1994/1 BG/MY/1994/2 |
| ටැරිනිපර් මෝටරය හා ස්ටාටරය සමග | 01 | |
| ටොකොලේස් ටී බ්‍රේකර් මෝටරය හා ස්ටාටරය සමග | 01 | |
| ඩබල් ටී පැකර් මෝටරය හා ස්ටාටරය සමග | 01 | |
| ඩස්ට් ෆෑන් | 02 | |
| විදරින් කාමරය | | |
| C. C. C. විදරින් ට්‍රොස් 100′ x 6′ ජ්ලීනම් චෙම්බර් සමග | 12 | |

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණපරිදි,

සමාගමේ ලේකම්.

06-118/6

---

### සීමාසහිත සම්පත් බැංකුව

1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය යටතේ විකිණීමයි

එම්. ආර්. එල්. රංජිත් - ගිණුම් අංක : 0020 5000 4069/1020 5000 9723.

1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2003.08.28 වන දින යෝජනා කොට සම්මත කරගනු ලැබ 2004.06.04 වන දින රජයේ *ගැසට් පත්‍රයේ* සහ 2004.05.25 දින 'දිවයින' 'තිනකුරල්' සහ 'ද අයිලන්ඩ්' යන දිනපතා පුවත්පත් වලද පළ කරන ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් පන් ලක්ෂ හතලිස් හත් දහස් තුන්සිය අසූ තුනයි ශත හැත්තෑ දෙකක (රු.5,47,383.72) මුදල සමග රුපියල් හාරලක්ෂ විසිතුන් දහස් එකසිය දහනවයයි ශත හතලිස් තුනක (රු.4,23,119.43) මුදල සඳහා වසරකට සියයට විසිඑක (21%) බැගින් 2002 දෙසැම්බර් 13 වැනි දා සිට වෙන්දේසි දින තෙක් තවදුරටත් පොලී මුදලද සමග ප්‍රචාරක වියදම් හා වෙනත් අයකිරීම් වෙතොත් ඒවාද සමග එතෙක් ගෙවා ඇති යම් මුදලක් (වේ නම්) අඩුකොට අයකර ගැනීම සඳහා මෙහි පහත උපලේඛනයේ වඩාත් මැනැවින් විස්තර කොට ඇති දේපල හා පරිශ්‍රය මහනුවර බලයලත් වෙන්දේසිකරු අයි. ඩබ්ලිව්. ජයසූරිය විසින් 2006.06.26 දින පෙ. ව. 10.00 ට පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

උපලේඛනය

සබරගමුව, පළාතේ රත්නපුර දිස්ත්‍රික්කයේ, කුරුවිටි කෝරලේ, පල්ලෙ පත්තුවේ ඇහැලියගොඩ ප්‍රාදේශීය සභා සීමාව ඇතුළත කැන්දන්ගමුව ඉහලගම පිහිටි අසීස්වත්ත නැමැති ඉඩමෙන් බලයලත් මිනින්දෝරු එම්. ඒ. සෝමරත්න විසින් සාදන ලද 1968 දෙසැම්බර් 28 දාතම හා අංක 2376 දරන පිඹුරේ නිරූපිත ලොට් 1 වශයෙන් ලකුණු කොට දක්වා ඇති, අවිස්සාවේල්ල ඉඩම් කාර්යාලයේ V113/271 ශීර්ෂය යටතේ ලියා පදිංචි කොට ඇති, උතුරට ඉල්ලතරපෙඩිගහේන ද නැගෙනහිරට: එම ඉඩමේම කොටසක කම්බි වැට ද දකුණට: පෙරුන්කඩපෙඩිගහේන ද සහ බටහිරට: පෙරුන්කඩපෙඩිගහේන සහ ඇල ද මායිම් වන එකී අංක 2376 පිඹුරට අනුව අක්කර එකයි රූඩ් තුනයි පර්චස් දහඅටක් (අක්. 1, රූඩ් 3, පර්. 18) වන බෙදා වෙන් කොට සීමා නිර්නය කළ සම්පූර්ණ ඉඩම එහි පස, ගහකොල, වගාවන්, ගොඩනැගිලි සහ අනෙකුත් සියළු දේ සමගය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගමේ ලේකම්.

06-118/2

---

සීමාසහිත සම්පත් බැංකුව

1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය යටතේ විකුණුම් නිවේදනය

එච්. එම්. ඩබ්. බණ්ඩාර සහ ආර්. එම්. සී. රත්නායක
ගිණුම් අංක 0007 5003 7992.

1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2002.11.14 වන දින යෝජනා කොට සම්මත කරගනු ලැබ 2003.09.05 වන දින රජයේ *ගැසට් පත්‍රයේද* 2003.08.23 වන දින "දිවයින" " ද අයිලන්ඩ්" සහ "තිනකරන් "යන දිනපතා පුවත්පත් වලද පළ කරන ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් නව ලක්ෂ දහනව දහස් නවසිය හැටහයයි ශත අනූපහක (රු. 9,19,966.95) මුදල සමග තවත් රුපියල් හත් ලක්ෂයක (රු. 7,00,000) මුදල සඳහා වසරකට සියයට විසිතුන (23%) බැගින් වෙන්දේසි දින තෙක් තවදුරටත් පොලී මුදලද සමග ප්‍රචාරක වියදම් හා වෙනත් අය කිරීම් වෙතොත් ඒවාද සමග, එතෙක් ගෙවා ඇති යම් මුදලක් (වේ නම්) අඩුකොට අයකර ගැනීම සඳහා මෙහි පහත උපලේඛනයේ වඩාත් මැනැවින් වි ස්තර කොට ඇති දේපල හා පරිශ්‍රය මහනුවර බලයලත් වෙන්දේසිකරු අයි. ඩබ්ලිව්. ජයසූරිය විසින් 2006.06.23 වන දින ප. ව. 3.00 ට පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

උපලේඛනය

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, ගහවට කෝරලේ, දැනට මහනගර සභා සීමාව ඇතුළත ධර්මාශෝක මාවතේ පිහිටි, බලයලත් මිනින්දෝරු ආර්. සී. ඒ. ඩිලාමොටේ විසින් සාදන ලද 1972 සැප්තැම්බර් 18 දාතම හා අංක 4624 දරන පිඹුරේ ලොට් 1 වන කලින් ධර්මාශෝක මාවතේ වරිපනම් අංක 19 සහ 20 වූ දැනට වරිපනම් අංක 157 සහ 161 දරන මුස්ලිම් වත්ත නැමැති ඉඩමෙන් මහනුවර බලයලත් මිනින්දෝරු පී. එච්. ටී. ද සිල්වා විසින් සාදන ලද 1992 නොවැම්බර් 24 දාතම හා අංක 504 A දරන පිඹුරේ ලොට් 2 වශයෙන් ලකුණු කොට නිරූපිත, මහනුවර ඉඩම් කාර්යාලයේ වෙළුම/පත්‍රිකාව A238/233 හි ලියාපදිංචි කොට ඇති, නැගෙනහිරට: බටුවත්ත, වරිපනම් අංක 11 දරන පරිශ්‍රය (කලින් ලොකු මැණිකාගේ ඉඩම)ද දකුණට: එකී පිඹුරේ ලොට් 1 ද, බටහිරට: ධර්මසේකර මාවත ද, සහ වයඹට: මහ නගර සභා පාරද, මායිම් වන, ප්‍රමාණයෙන් පර්චස් දාහතරයි දශම හතයි පහක් (අක්. 0, රූඩ් 0, පර්. 14.75) හෝ හෙක්ටයාර් 0.03242 ක් වන බෙදා වෙන්කොට සීමා නිර්නය කළ බිම් කොටස එහි ඇති ගොඩනැගිලි, වගාවන්, සහ අනෙක් සියළුම දේ සමගය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගමේ ලේකම්.

06-118/1

---

සීමාසහිත සම්පත් බැංකුව

1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධානය) පනතේ 09 වන වගන්තිය යටතේ විකුණුම් නිවේදනය

වයි. කේ. එන්. වීරසිංහ
ගිණුම් අංක : 0013 5001 3357.

1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2003.11.27 වන දින යෝජනා කොට සම්මත කර ගනු ලැබ 2004.02.13 දින රජයේ *ගැසට් පත්‍රයේ* සහ 2004.01.16 දින "දිවයින" "අයිලන්ඩ්" සහ "තිනකරන් " යන දිනපතා පුවත්පත් වලද පල කරන ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් දොළොස් ලක්ෂ විසිඑක් දහස් අටසිය හතලිස් හතරයි ශත හතලිස් දෙකක (රු.1,221,844.42) මුදලද සහ තවත් රුපියල් අට ලක්ෂ හතලිස් නවදහස් දෙසීය පනහක (රු.8,49,250) මුදල සඳහා වසරකට සියයට විසි එක (21%) බැගින් 2003 සැප්තැම්බර් 27 වන දින සිට වෙන්දේසි දින තෙක් තවදුරටත් පොලී මුදලද, ප්‍රචාරක වියදම් හා වෙනත් අයකිරීම් වෙතොත් ඒවාද සමග, එතෙක් ගෙවා ඇති යම් මුදලක් (වේ නම්) අඩුකොට අයකර ගැනීම සඳහා මෙහි පහත උපලේඛනයේ වඩාත් මැනැවින් විස්තර කොට ඇති දේපල හා පරිශ්‍රය මහනුවර බලයලත් වෙන්දේසිකරු අයි. ඩබ්ලිව්. ජයසූරිය විසින් 2006.06.26 දින ප.ව. 3.00 ට පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරලේ, පල්ලේපත්තුවේ, මහරගම ප්‍රාදේශීය සභාවේ පරිපාලන සීමාව ඇතුළත පන්නිපිටියේ පිහිටි පන්සල පාරේ, වරිපනම් අංක 159/84 දරන බටදොඹගහකුඹුර නැමැති ඉඩමෙන් බලයලත් මිනින්දෝරු ඒ. ඊ. සී. ප්‍රනාන්දු විසින් සාදන ලද 1988 අප්‍රේල් 01 දාතම හා අංක 1115 දරන පිඹුරේ නිරූපිත ලොට් 4 වශයෙන් ලකුණු කොට දක්වා ඇති, කොළඹ ඉඩම් කාර්යාලයේ වෙළුම/පත්‍රිකාව එම් 2397/186 හි ලියාපදිංචි කොට ඇති එකී අංක 1115 පිඹුරට අනුව උතුරට (වී. සී.) පාරද නැගෙනහිරට: ලොට් 5 ද, දකුණට: රාමනායක ආරච්චිගේ බටදොඹගහ කුඹුර සහ මොහොට්ටිගේ කුඹුරද සහ බටහිරට: ලොට් 3 ද මායිම් වන, ප්‍රමාණයෙන් පර්චස් පහළොවක් (අක්. 0, රූඩ් 0, පර්. 15) වන බෙදා වෙන් කොට සීමා නිර්ණය කළ සම්පූර්ණ බිම් කොටස එහි පිහිටි ගහකොල, වගාවන්, ගොඩනැගිලි සහ අනෙකුත් සියලුම දේ සමගය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගමේ ලේකම්.

096-118/4

## ලංකා බැංකුව

### 1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද බැංකු ආඥාපනතේ (397 අධිකාරය) හා එහි සංශෝධනවල 22 වෙනි වගන්තිය යටතේ විකිණීම පිළිබඳ දැන්වීම.

ඒ. එම්. ඒ. කොඩිතුවක්කු මහතාගේ වගකීම් සඳහා දේපල උකස

ලංකා බැංකු ආඥාපනතේ 19 වෙනි වගන්තිය යටතේ ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරනු ලැබ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2003.04.11 දිනැති අංක 1284 දරන *ගැසට් පත්‍රයේ* හා 2003 අප්‍රේල් 07 දිනැති දිනමිණ, තිනකරන්, හා ඩේලි නිවුස් යන පුවත්පත් වල පල කරන ලද යෝජනාවකට අනුකූලව එකී ආඥාපනතේ අංක 26 දරන වගන්තිය යටතේ අයකර ගතහැකි මුල් මුදලේ ශේෂයද, විකිණීම කෙරෙන දිනය තෙක් ඒ මත අයවිය යුතු පොලියද, ගාස්තු හා මුදල් අයකර ගැනීම පිණිස මෙහි පහත උපලේඛනයේ විස්තර කොට ඇති දේපල හා පරිශ්‍ර පිහිටි ස්ථානයේදීම 2006 ජුනි 24 වෙනි දින පෙ.ව. 11.00 ට කොළඹ 03, ධර්මපාල මාවත, අංක 55 හි පදිංචි වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම මහතුන් විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දන්වා සිටිනු ලැබේ.

#### පළමු වැනි උපලේඛනය

සල්පිටි කෝරලයේ, පල්ලේපත්තුවේ, කොළඹ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කොට්ඨාසයේ කොළඹ මහ නගර සභා සීමාවේ කොට්ඨාස 43, වැල්ලවත්ත උතුරේ පිහිටි වැල්ලවත්ත හැව්ලොක් පාර, වරිපනම්, අංක 235 දරන වැල්ල, අඹගහවත්ත *හෙවත්* අඹගහවත්ත නැමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු ආර්. එන්. ද සිල්වා විසින් සාදන ලද 1977 ජුලි 25 දිනැති අංක 1839 දරන මිණුම් පිඹුරේ (CM/0/1/1182/1052)විස්තර කළ ලොට් 17AZ වශයෙන් සඳහන් බෙදන ලද්දාවූ නිශ්චිත ඉඩම් කැබැල්ල උතුරට : ලොට් 17BA සහ17 BK නැගෙනහිරට ලොට් 17BK ද, ලොට් 17 AY සහ හැව්ලොක් පාරද ද බස්නාහිරට ලොට් 17 BA සහ හැව්ලොක් පාරද, මායිම්ව එකී අංක 1839 දරන පිඹුර අනුව පර්චස් දෙකකින් (අ. 0, රූ.0, පර්. 2) යුක්ත වේ. මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ A620/145 හි ලියාපදිංචි කර ඇත.

සල්පිටි කෝරලයේ පල්ලේපත්තුවේ කොළඹ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කොට්ඨාසයේ කොළඹ මහ නගර සභා සීමාවේ කොට්ඨාස 43, වැල්ලවත්ත උතුරේ පිහිටි වැල්ලවත්ත හැව්ලොක් පාර, වරිපනම් අංක 237 දරන වැල්ල අම්බලම්වත්ත *හෙවත්* අම්බලම්වත්ත නැමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු ආර්. එන්. ද සිල්වා විසින් සාදන ලද 1977 ජුකි 25 දිනැති එකී අංක. 1839 දරන පිඹුරේ (CM/0/1/1182/1052) විස්තර කළ ලොට් 17AY වශයෙන් සඳහන් බෙදන ලද්දාවූ නිශ්චිත ඉඩම් කැබැල්ල උතුරට : ලොට් 17AZ නැගෙනහිරට : ලොට් සහ 17BK සහ 17AX ද, දකුණට : ලොට් 17AX සහ හැව්ලොක් පාරද, බස්නාහිරට : ලොට් 17AZ සහ හැව්ලොක් පාරද, මායිම්ව එකී අංක. 1839 දරන පිඹුර අනුව පර්චස් දෙකයි දශම බිංදුවයි දෙකක (අ. 0, රූ. 0, පර්. 2.02) බිම් ප්‍රමාණය සමග එහි පිහිටි ගොඩනැගිලි ගහකොළ වැවිලි සියලු දේ වේ. කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ 620/146 හි ලියාපදිංචි කර ඇත.

#### දෙවැනි උපලේඛනය

ලොට් අංක 17AW, 17BK, 17BL, සහ 17BM (පාර සඳහා වෙන්කළ පොදු ඉඩම්, පාර, වැසිකිළි, නානකාමර සහ පහසුකම්) වශයෙන් සඳහන් බෙදනලද්දාවූ නිශ්චිත ඉඩම් කැබැල්ල උතුරට : 17A, 17B, 17AQ, 17AR, 17AX, සහ 17BB , නැගෙනහිරට 17B-17U, 17BN 17AE සහ 17AJ දකුණට : ලොට් 17BN, 17AH, 17AI, 17AJ, 17 A U 17AV සහ ස්වර්ණ පාරද, බස්නාහිරට : 17AK-17AV, 17AX, 17AY, 17AZ, 17BA-17BJසහ හැව්ලොක් පාරද, මායිම්ව එකී අංක. 1839 දරන පිඹුර අනුව පර්චස් තිස්හතයි දශම තුනයි දෙකක (අ. 0, රූ. 0, පර්. 37.32) ප්‍රමාණයෙන් යුක්ත වේ. මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ A620/224 හි ලියාපදිංචි කර ඇත.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

එම්. පරතලිංගම්,
සම්බන්ධතා කළමනාකරු,
(අයකරගැනීම්).

ලංකා බැංකුව,
අයකරගැනීමේ ඒකකය..

06-123

---

## ලංකාබැංකුව

### 1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) හා එහි සංශෝධනවල 22 වෙනි වගන්තිය යටතේ විකිණීම පිළිබඳ දැන්වීම

ණය යොමු අංකය : 447/97.

ලංකා බැංකු ආඥාපනතේ 19 වෙනි වගන්තිය යටතේ ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරනු ලැබ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2000.06.30 දිනැති අංක 1139 දරන *ගැසට් පත්‍රයේ* හා 2000.06.27 දිනැති දිනමිණ, ඩේලිනිවුස්, හා තිනකරන් යන පුවත්පත්වල පල කරන ලද යෝජනාවකට අනුකූලව ඇති ආඥාපනතේ අංක 26 දරන වගන්තිය යටතේ අයකර ගත හැකි මුල් මුදලේ ශේෂයද, විකිණීම කෙරෙන දිනය තෙක් ඒ මත අයවියයුතු පොලියද, ගාස්තු හා මුදල්ද අයකර ගැනීම පිණිස මෙහි පහත උපලේඛනයේ විස්තර කොට ඇති දේපල හා පරිශ්‍ර පිහිටි ස්ථානයේදීම 2006.07.20 දින පෙරවරු 10.30 ට හලාවත, රදගුරු මාවත, අංක 15 හි පදිංචි වෙන්දේසිකාර ඩී. එල්. ජේ.නිශ්ශංක මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දන්වා සිටිනු ලැබේ.

#### උපලේඛනය

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, හලාවත ලියාපදිංචි කොට්ඨාසයේ, උතුරු පිටිගල් කෝරලේ, මුන්නේස්වරම්පත්තුවෙහි වෙරළබඩ ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ වැලිහේන මැදවත්තෙහි පිහිටියාවූද, "මැදවත්ත" යනුවෙන් හඳුන්වන සහ නැමැති ඉඩමෙන් අංක 46/12/3 දරන ගොනුව යටතේ සර්වේයර් ජනරාල් විසින් අඳින ලද 1990.02.14 දිනැති පීපී පු අංක 2608 හි විස්තර කරන ලද්දාවූ ලොට් 108 වශයෙන් බෙදන ලද එකී ලොට් 108 හි මායිම් නම්, උතුරට: පීපී පු 2608 හි ලොට් 99, නැගෙනහිරට: ලොට් 99 සහ 107 දකුණට: ලොට් 109, බස්නාහිරට: එකී පිඹුරේ ලොට් 122ද, මායිම්ව හෙක්ටයාර් 0.051 හෝ පර්චස් විස්සයි දශම තුනයි හයක(අ. 0, රූ. 0, පර්. 20.36) බිම් ප්‍රමාණය සමග වැවිලි ගොඩනැගිලි සහ පිහිටි සියලු දේ වේ.

මෙය හලාවත ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එල්ඩීබී 116 යටතේ හා වඩා නිවැරදි හලාවත ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එල්ඩීබී හලා 4/776 සහ එල්ඩීබී හලා 13/168 හි ලියාපදිංචි කර ඇත. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපති ආර්. ප්‍රේමදාස

මැතිතුමාගේ කාර්යාල අත්සන සහ මුද්‍රාව යටතේ නිකුත් කර 1990 පෙබරවාරි 14දිනැති රජයේ ප්‍රදාන කිරීමේ බලය අනුව අංක. 10723 ත් හා යටතේ අයිතිව ඇත.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ටී. බී. නිව්ටන්,
කළමනාකරු.

ලංකා බැංකුව,
හලාවත.

06-120

## මහජන බැංකුව-ලිබර්ටි ප්ලාසා ශාඛාව

1986 අංක 32 පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 වන වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

ගම්පහ දිස්ත්‍රික්කයේ රාගම ඉහළ ගම පාරේ අංක 1116/බී හි පිහිටි ගොරකගහවත්ත නැමති ඉඩමේ ලොට් අංක 1 දරන විශාලත්වය පර්චස් 10.00ක් වටිනා ඉඩම හා නිවස මහජන බැංකුව විසින් මා වෙත පවරන ලද බලය යටතේ මා විසින් 2006.07.08 දින පෙරවරු 11.00ට දේපල පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ. රජයේ *ගැසට් පත්‍රයේ* 2003.12.12 දිනද ඩේලිනිවුස්, දිනමිණ හා තිනකරන් පුවත්පත්වල 2003.11.26 දිනයන්හි ද, පලකර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරවමු.

*දේපලට පිවිසීම* :- රාගම වෛද්‍ය විද්‍යාල භූමිය අවසානයේ වමට ඇති ඉහලගම පාරෙන් හැරී මීටර් 500ක් පමණ ගියවිට දකුණට ඇති ජිනසේන පාරේ මීටර් 20ක් ගියවිට පාරේ දකුණු පස අංක 1116/බී දරන තුන්වන නිවස.

ගෙවීමේ ක්‍රමය :- වෙන්දේසිය අවසානයේ සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවිය යුතුය :

1. ගැනුම් මිලෙන් 10%,
2. පලාත් අධිකාරි බදු සඳහා පලාත් අධිකාරියට 1%,
3. වෙන්දේසියේ කොමිස් වශයෙන් 2 1/2%,
4. ලිපිකරු හා නිවේදකයාගේ ගාස්තු වශයෙන් රු. 500,
5. විකුණුම් වියදම් හා වෙනත් ගාස්තු වෙතොත් එම මුදල,
6. විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු.

ගැනුම් මිලෙන් 90%ක් වූ මුදල විකුණුම් දින සිට දින 30ක් ඇතුලත සහකාර සාමාන්‍යාධිකාරි වෙත (බටහිර කලාප 01) මහජන බැංකුව, කලාපීය ප්‍රධාන කාර්යාලය (බටහිර කලාප 01) අංක 11, ආදිපාද වීදිය, කොළඹ 01 වෙත ගෙවිය යුතුය.
දුරකථන අංක : 011-2387068, 0112393678 ෆැක්ස් අංක: 011-2435977

හිමිකම් ඔප්පු සහ වෙනත් අදාල විස්තර ඉහත සඳහන් ලිපිනයෙන් ලබාගත හැක. ඉහත සඳහන් කරන ලද පරිදි සඳහන් කළ මුදල් දින 30ක් ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැනුම් මුදලින් 10% මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපල විකිණීමට බැංකුවට අයිතිය ඇත.

සී. කුමාරසිංහ,
බලයලත් වෙන්දේසිකරු, තක්සේරුකරු,
සහ උසාවි කොමසාරිස්.

අංක 60/50, දෙල්ගහවත්ත,
පමුණුව පාර, මහරගම.
දුරකථන අංක : 011-2746383

06-117

## මහජන බැංකුව - මරදාන ශාඛාව

1986 අංක 32 පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වන වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

මාලබේ, තලාහේන අංක 99/1 දරන කොළඹ සංවර්ධන සහා සීමාව තුළ පිහිටි වටිනා පදිංචියට සුදුසු දේපල විශාලත්වය පර්චස් 15 මහජන බැංකුව විසින් මා වෙත පවරන ලද බලය යටතේ 2006.07.15 දින පෙරවරු 11.00ට දේපල පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ. රජයේ *ගැසට් පත්‍රයේ* 2003.04.04 දිනද, ඩේලි නිවුස්, දිනමිණ හා තිනකරන් පුවත්පත්වල 2003.03.25 දිනද පලකර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*දේපලට පිවිසීම* :- තලාහේන හන්දියෙන් හිඹුටාන පාරේ ගොස් තලාහේන මහා විද්‍යාලය අසලින් ඇති පරාක්‍රම මාවතේ මීටර 300 පමණ ගියතැන පරාක්‍රම මාවත 2 පටුමගේ යාර 100 පමණ ගියවිට පාරේ දකුණ පස අංක 99/1, දරන දේපල පිහිටා ඇත.

*ගෙවීම් ක්‍රමය* .- වෙන්දේසිය අවසානයේ සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවිය යුතුය.

1. ගැනුම් මිලෙන් 10%,
2. පලාත් අධිකාරි බදු සඳහා පලාත් අධිකාරියට 1%,
3. වෙන්දේසියේ කොමිස් වශයෙන් 2 1/2%,
4. ලිපිකරු හා නිවේදකයාගේ ගාස්තු වශයෙන් රු. 500,
5. විකුණුම් වියදම් හා වෙනත් ගාස්තු වෙතොත් එම මුදල,
6. විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු.

ගැනුම් මිලෙන් 90%ක් වූ මුදල විකුණුම් දින සිට දින 30ක් ඇතුලත සහකාර සාමාන්‍යාධිකාරි (බටහිර කලාප 01) මහජන බැංකුව, කලාපීය ප්‍රධාන කාර්යාලය (බටහිර කලාප 01) අංක 11, ආදිපාද වීදිය, කොළඹ 01 වෙත ගෙවිය යුතුය.

දුරකථන අංක : 011-2387068, 0112393678 ෆැක්ස් අංක 011-2435977.

හිමිකම් ඔප්පු සහ වෙනත් අදාල විස්තර ඉහත සඳහන් ලිපිනයෙන් ලබාගත හැක.

ඉහත සඳහන් කරන ලද පරිදි සඳහන් කළ මුදල් දින 30ක් ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැනුම් මුදලින් 10% මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපල විකිණීමට බැංකුවට අයිතිය ඇත.

සී. කුමාරසිංහ,
බලයලත් වෙන්දේසිකරු, තක්සේරුකරු,
සහ උසාවි කොමසාරිස්.

අංක 60/50, දෙල්ගහවත්ත,
පමුණුව පාර, මහරගම.
දුරකථන අංක: 011-2746383

06-116

## ලංකා බැංකුව

### 1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 22 වැනි වගන්තිය යටතේ විකිණීම පිළිබඳ දැන්වීම

අංක 51/20, ප්‍රින්සස් ගේට්, කොළඹ 12, හි පිහිටි අසාඩ් එන්ටර්ප්‍රයිසස් හි ණය වගකීම් සඳහා උකස් කළ දේපල, තනි අයිතිකරු යූ. එම්. නවාස්

ලංකා බැංකු ආඥාපනතේ 19 වෙනි වගන්තිය යටතේ ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරනු ලැබ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ 2005.08.05 දිනැති අංක 1405 දරන *ගැසට් පත්‍රයේ* හා 2005.07.29 දිනැති ඩේලිනිවුස්, දිනමිණ හා තිනකරන් යන පුවත්පත්වල පළ කරන ලද යෝජනාවකට අනුකූලව, 2006.04.30 දින හෝ ඊට පෙර ගෙවිය යුතු යැයි අධිකරණයේ දී දෙපාර්ශවය විසින් එකහවූ පරිදි බේරීමට අත්සන් කරන ලද නියමයන්ට අනුව රු. මිලියන 2.4 ක ශේෂය හා එකී ආඥාපනතේ අංක 26 දරන වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස මෙහි පහත උපලේඛනයේ විස්තර කොට ඇති දේපල හා පරිශ්‍ර පිහිටි ස්ථානයේදී ම 2006 ජූනි 25 වෙනි දින පෙ.ව. 11.00 ට කොළඹ 04, බම්බලපිටිය, අසෝක ගාර්ඩින්ස්, අංක 09 හි පදිංචි වෙන්දේසිකාර ආර්. එස්. එම්. වෙන්දේසිකාර මහතුන් විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දන්වා සිටිනු ලැබේ.

#### පළමුවන උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ හා මහ නගර සභා සීමාවේ නැගෙනහිර අලුත්කඩේ කොට්ඨාස අංක 16 හි ප්‍රින්සස් ගේට්ටුවේ පිහිටියාවූද දැන් එක් ඒකකයක් වශයෙන් පාවිච්චි කරන්නාවූ (ප්‍රින්සස් ගේට් වරිපනම් අංක 51/20 දරන පරිශ්‍රය) (බලයලත් මිනින්දෝරු කේ. බාලසුන්දරම් විසින් සාදන ලද 1973 මාර්තු 20 දිනැති අංක 15/1973 දරන පිඹුරේ විස්තර කළ ලොට් 57) සහ බලයලත් මිනින්දෝරු බී. කේ. පී. ඕකඳපොල විසින් සාදන ලද 1989 සැප්තැම්බර් 15 දිනැති අංක 176/1989 දරන පිඹුරේ විස්තර කළ ලොට් 42-1 64-1 සහ (64-2) බලයලත් මිනින්දෝරු සහ තලම්තිකරු බී. කේ.පී. ඕකඳපොල විසින් සාදන ලද 1989 සැප්තැම්බර් 15 දිනැති අංක 177/1989 දරන පිඹුරේ විස්තර කළ ලොට් 1 වශයෙන් සඳහන් බෙදන ලද්දාවූ නිශ්චිත ඉඩම් කැබැල්ල (ඉඩම් කැබලි 4 ඒකාබද්ධ කර නිර්මාණය කර ඇති අදාල ස්ථිර පදිංචි නිවස සමග ඉඩම උතුරට: ශ්‍රී සංඝරාජ මාවත, වරිපනම් අංක. ජී. 441 දරන පරිශ්‍රයද, දකුණට: එකී 1973 මාර්තු 20 දිනැති අංක 15/1973 දරන පිඹුරේ ලොට් 58 සහ ලොට් 58 හි ඉතිරි කොටසක්ද, නැගෙනහිරට: බලයලත් මිනින්දෝරු කේ.බාලසුන්දරම් විසින් සාදන ලද 1973 මාර්තු 20 දිනැති අංක 15/1973 දරන පිඹුරේ ලොට් 42 (කොටසක්) සහ ලොට් 64 හි ඉතිරි කොටසද සහ බස්නාහිරට: එකී 1973 මාර්තු 20 දිනැති අංක 15/1973 දරන පිඹුරේ ලොට් 12 (දැන් ලොට් 23) හි ඉතිරි කොටස ද මායිම්ව එකී අංක. 177/1989 දරන පිඹුර අනුව පර්චස් තුනයි දශම පහයි තුනක (අ.0, රූ. 0, පර්. 3.53) ප්‍රමාණයෙන් යුක්ත වේ. මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ. 549/286 හි ලියාපදිංචි කර ඇත.

එකී ඉඩම් කැබැල්ල නැවත මැන පහත සඳහන් පරිදි විස්තර කර ඇත.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ සහ මහ නගර සභා සීමාවේ, නැගෙනහිර අලුත්කඩේ කොට්ඨාස අංක 16 හි ප්‍රින්සස් ගේට්ටුව අසල පිහිටියාවූ ද ප්‍රින්සස් ගේට් වරිපනම් අංක 51/20 දරන පරිශ්‍රය සහ ප්‍රින්සස් ගේට් ජී 51 හි කොටසක් වශයෙන් මනිනලද්දාවූ බලයලත් මිනින්දෝරු කේ. බාලසුන්දරම් විසින් සාදන ලද 1973 අප්‍රේල් 09 දිනැති අංක 15/1973 දරන පිඹුරේ ලොට් 57 වශයෙන් විස්තර කළ සහ ප්‍රින්සස් ගේට් වරිපනම් අංක 51/20 දරන හා බලයලත් මිනින්දෝරු කේ. නඩරාජා විසින් සාදන ලද 1996 මැයි 11 දිනැති අංක 2442 දරන පිඹුරේ ලොට් 1 වශයෙන් සඳහන් ඉඩම් කැබැල්ල සමග ගොඩනැගිල්ල සහ සියලු දේ සමග උතුරට: ශ්‍රී සංඝරාජ මාවත වරිපනම් අංක 441 දරන පරිශ්‍රය ද, නැගෙනහිරට: ප්‍රින්සස් ගේට් වරිපනම් අංක 51/22 දරන පරිශ්‍රය ද, දකුණට: ප්‍රින්සස් ගේට් (කොටසක්) වරිපනම් අංක 51 දරන පරිශ්‍රයද, බස්නාහිරට: ප්‍රින්සස් ගේට් වරිපනම් අංක 510 දරන පරිශ්‍රයේ කොටසක් ද, මායිම්ව එකී අංක 2442 දරන පිඹුර අනුව පර්චස් බිංදුවයි හතරයි දශම හතරයි පහක (අ.0, රූ. 0, පර්. 4.45) හෝ හෙක්ටයාර් 0.011258 ක ප්‍රමාණයෙන් යුක්ත වේ.

එකී ඉඩම පහත සඳහන් පරිදි විස්තර කර ඇත:

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ සහ මහ නගර සභා සීමාව තුළ කොට්ඨාස අංක 16, නැගෙනහිර අලුත්කඩෙහි ප්‍රින්සස් ගේට් හි පිහිටියාවූද වරිපනම් අංක 51/20 දරන ස්ථානයේ පිහිටි ගොඩනැගිලි සමග බලයලත් මිනින්දෝරු එස්. ලෝගනාදන් විසින් සාදන ලද 1996 ඔක්තෝබර් 22 දිනැති අංක 4546 දරන පිඹුරේ විස්තර කළ ලොට් X වශයෙන් සඳහන් ඉඩම් කැබැල්ල උතුරට: අංක 441 (සංඝරාජ මාවත) දරන වත්ත ද, නැගෙනහිරට: වරිපනම් අංක 51/21 දරන පරිශ්‍රය (ප්‍රින්සස් ගේට්), දකුණට: ප්‍රින්සස් ගේට්ටුවට අඩි පාර සහ ප්‍රවේශ මාර්ගය ද, බස්නාහිරට: අංක 51 (ප්‍රින්සස් ගේට්) දරන වත්තේ කොටසක් දැන් අංක 75 දරන පරිශ්‍රයේ කොටසක් (ප්‍රින්සස් ගේට්) ද මායිම්ව පර්චස් හතරයි දශම පහයි බිංදුවක (අ.0, රූ. 0, පර්. 4.50) ප්‍රමාණයෙන් යුක්ත වේ.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

එම්. පරතලිංගම්,
සම්බන්ධතා කළමනාකරු.

2006 මැයි මස 04 වැනි දින,
ලංකා බැංකුව,
අයකරගැනීමේ ඒකකය - ශාඛා,
ප්‍රධාන කාර්යාලය,
3 වැනි මහල.

06-121

---

## ජාතික ඉතිරිකිරීමේ බැංකුව

### සංශෝධිත පරිදි වූ 1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය යටතේ විකිණීම

ජාතික ඉතිරිකිරීමේ බැංකුව සතු අගනා දේපලක් වෙන්දේසියේ විකිණීම

ඌව පළාතේ බදුල්ල දිස්ත්‍රික්කයේ, බෝගොඩ කෝරලයේ, යටිකිඳ කොට්ඨාසයේ හාලිඇල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුලත දික්වැල්ල වසමේ මැදපිට පිහිටි "කරඳගස් පිටියවත්ත" නමැති ඉඩමේ, ලොට් අංක 7 ලෙස දක්වා ඇති, පර්චස් 15.3 ක විශාලත්වය ඇති බිම් කට්ටිය.

#### දේපල විස්තරය

ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, බෝගොඩ කෝරළේ යටිකිඳ කොට්ඨාසයේ හාලිඇල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත, දික්වැල්ල වසමේ, මැදපිට පිහිටි කරඳගස්පිටියවත්ත නමැති ඉඩමේ, බලයලත් මිනින්දෝරු ඩී. ප්‍රසාද් වි මලසේන විසින් මැන සාදන ලද අංක බී 138 හා 1997.09.06 දින දරන පිඹුරේ ලොට් අංක 7 ලෙස ලකුණු කළ බෙදා වෙන්කළ බිම් කට්ටිය වන උතුරට: ලොට් අංක 4 (අඩි 10 ක් පළල පාරක් වන) ලොට් අංක 5 සහ ලොට් අංක 8, නැගෙනහිරට: ලොට් අංක 8 සහ අඩි පාර ද දකුණට: ශ්‍රී බිම්බාරාමය පන්සල හිමිකම් කියන ඉඩම ද, බස්නාහිරට ලොට් අංක 5 සහ ලොට් අංක 6

ද යන මායිම් ඇතුළත ඉහත කී අංක බී 138 දරන පිඹුර ප්‍රකාර පර්චස් පහළොවකුත් දශම තුනයි බින්දුවක් (අ. 0, රූ.0, පර්. 15.30) *නොහොත්* හෙක්ටයාර 0.0387 විශාලත්වය ඇති බදුල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක බී302/220 යටතේ ලියාපදිංචි කර ඇති බිම් කට්ටිය සහ එහි පිහිටි සියළු දේ.

මෙම දේපල ජාතික ඉතිරිකිරීමේ බැංකුවට උකස් තබා ඇත්තේ, මාඋස්සගොල්ල නව මහල් නිවසේ අංක 12/30 හි පදිංචි ඩබ්ලිව්. ජී. පුංචිබන්ඩා මහතා විසිනි.

*දේපලට ලඟා වීම.–* බදුල්ල සිට බණ්ඩාරවෙල මාර්ගයේ හාලිඇල දක්වා ගොස් දකුණට හැරී, කිලෝමීටර් 125 වැනි කණුව පසුකර මීටර් 150 ක් ගියවිට ට්‍රාන්ස්ෆෝමරය අසලින් ජයතිලක මාවතේ මීටර් 750 ක් ගමන් කර වමට හැරී මීටර් 35 ක් ගියවිට දකුණු පැත්තේ අදාල දේපල පිහිටා ඇත.

මෙම දේපල අප විසින් 2006 ජුනි මස 22 බ්‍රහස්පතින්දා දින පෙ.ව. 11.00 ට දේපල පිහිටි ස්ථානයේ දී, ඊට අයත් සියළු දේ සමග ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*ගෙවීමේ ක්‍රමය :-*

සාර්ථක ගැනුම්කරු විසින් වෙන්දේසිය නිමවූ වහාම පහත සඳහන් මුදල් ප්‍රමාණයන් ගෙවිය යුතුය.

1. ගැනුම් මිලෙන් 25%;
2. ගැනුම් මිලෙන් 1% ක් ප්‍රාදේශීය සභා අයබදු සඳහා ගෙවිය යුතුය;
3. ගැනුම් මිලෙන් 2 1/2% ක් වෙන්දේසිකරුගේ කොමිස් මුදල ලෙස ගෙවිය යුතුය;
4. රු. 67,500 නොඉක්ම වන සම්පූර්ණ ප්‍රචාරක ගාස්තු වියදමෙන් 50% ක් ;
5. ලිපිකරුගේ හා සෝෂකකරුගේ ගාස්තුව රු. 500;
6. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ ගාස්තුව වශයෙන් රු. 3,000 ක් ගෙවිය යුතුය.

ගැනුම් මිලෙන් ඉතිරි වූ 75% ක් වූ මුදල, වෙන්දේසි දින සිට දින 30 ක් තුල බැංකුව වෙත ගෙවිය යුතුය.

වැඩිදුර විස්තර සහ විකුණුම් කොන්දේසි සඳහා,

සහකාර සාමාන්‍යාධිකාරි (ණය),
ජාතික ඉතිරිකිරීමේ බැංකුව,
අංක 255, ගාලු පාර,
කොළඹ 03.
දුරකථන අංකය : 2576132

ෂොක්මන් සහ සමරවික්‍රම.
ශ්‍රී ලංකාවේ බැංකු සඳහා පිළිගත්
පුරෝගාමී වරලත් වෙන්දේසිකරුවෝ
සහ තක්සේරුකරුවෝ.

*අගනුවර කාර්යාලය :*

55ඒ, ධර්මපාල මාවත,
කොළඹ 03.
දුරකථන අංක: 01-2448526
01-2441761
ෆැක්ස් : 01-2448526
ඊමේල් : සමර@ශ්‍රී ලංකා. නෙට්

*ප්‍රධාන කාර්යාලය:*

අංක 24, ටොරිංටන් පාර,
මහනුවර.
දුරකථන අංක: 081-2224371
081-2227593
081-2224371
ඊමේල් - සමර@ඩයමන්ඩ්.ලංකා.නෙට්

06-40

## සීමාසහිත සම්පත් බැංකුව

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 9 වන වගන්තිය යටතේ කෙරෙන විකිණීමේ දැන්වීම

ගිණුම් අංකය : 0002 - 1001-0831.
ග්‍රීන්හිල්

සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින්, 1990 අංක 04 දරන, බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ 2000.10.25 වන දින සම්මත කරගන්නා ලදුව, 2000.12.15 දින *ගැසට් පත්‍රයේ* සහ 2001 ජනවාරි 27 වන දින 'දිවයින' 'අයිලන්ඩ්', සහ 'තිනකරන්' යන දිනපතා පුවත්පත්වල පළ කරන ලද යෝජනා සම්මතය ප්‍රකාර රුපියල් හැටපන්ලක්ෂ දෙළොස් දහස් දෙසිය අසූ දෙකක් පමණක් (රු. 65,12,282) වූ මුදල සහ 2000.08.23 දින සිට විකිණීමේ දිනය දක්වා රුපියල් විසිහතර ලක්ෂ හැටනවදහස් අටසිය හැත්තෑ අටක් (රු.24,69,878) සඳහා වර්ෂයකට සියයට විසිහතර (24%) බැගින් හා රුපියල් දහඅටලක්ෂ අසූහතර දහසක් (රු.18,84,000) සඳහා වර්ෂයකට සියයට විසිතුන (23%) බැගින් පොලියද, ප්‍රචාරක ගාස්තු හා වෙනත් ගාස්තු ද යන මුදල් ප්‍රමාණ, ඉන්පසුව යම් මුදලක් ගෙවා ඇත්නම් ඒ මුදල අඩුකොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ විස්තර කර තිබෙන දේපළ, කොළඹ බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම මහතුන් විසින් 2006.07.12 වන දින පෙ.ව. 11.00 ට එම දේපළ පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ මහ නගර සභා සීමාව ඇතුළත පිටකොටුවේ වොල්පෙන්ඩෝල් හි පිහිටි 1 වන මොස්ක් පටුමග, වරිපනම් අංක 42 දරන හා බලයලත් මිනින්දෝරු එස්. ඩී. නවරත්නම් විසින් මැන සාදන ලද අංක 229 හා 1953 සැප්තැම්බර් 7 දින දරන පිඹුරේ පෙන්නුම් කර තිබෙන බෙදා වෙන් කළ ඉඩම හා පරිශ්‍රය වන උතුරට : 1 වන මොක්ස් පටුමග, වරිපනම් අංක 46 දරන පරිශ්‍රය හා සිරිපිනා පටුමග, වරිපනම් අංක 43 දරන පරිශ්‍රයේ වත්තද, නැගෙනහිරට සිරිපිනා පටුමග වරිපනම් අංක 43 දරන පරිශ්‍රයේ වත්ත ද, දකුණට : 1 වන මොක්ස් පටුමග, වරිපනම් අංක 38 දරන පරිශ්‍රයද, බස්නාහිරට : 1 වන මොස්ක් පටුමගද යන මායිම් ඇතුළත වරිපනම් අංක 38 දරන පරිශ්‍රය ද, බස්නාහිරට : 1 වන මොස්ක් පටුමග යන මායිම් ඇතුළත ඉහත කී අංක 229 දරන පිඹුර ප්‍රකාර පර්චස් අටකුත් දශම එකයි දෙකක් (අ. 0, රූ. 0, පර්. 8.12) විශාලත්වය ඇති බිම් කට්ටිය සහ එහි පිහිටි ගසකොළ, වැව්ලි, ගොඩනැගිලි යනාදී සියලු දේ.

මෙම ඉඩම කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ 890/220 යටතේ ලියාපදිංචි වී ඇත.

මෙම ඉඩම බලයලත් මිනින්දෝරු එස්. රාසප්පා විසින් නැවත මනින ලදුව අංක 3586 හා 1992 මාර්තු 14 දින දරන පිඹුරට අනුව පහත දැක්වෙන පරිදි විස්තර කර ඇත :

ඉහත කී පිටකොටුවේ වොල්පෙන්ඩෝල් හි පිහිටි 1 වන මොස්ක් පටුමග, වරිපනම් අංක 42 දරන ඉහත කී අංක 3586 දරන පිඹුරේ පෙන්නුම් කර තිබෙන බෙදා වෙන් කළ බිම් කට්ටිය (මෙහි ඉහත සම්පූර්ණයෙන් විස්තර කර තිබෙන ඉඩම හා පරිශ්‍රය නැවත මැනීමක් වන) බිම් කට්ටියට මායිම් උතුරට : 1 වන මොස්ක් පටුමග වරිපනම් අංක 46 දරන පරිශ්‍රය ද, නැගෙනහිරට සිරිපිනා පටුමග, වරිපනම් අංක 43 දරන පරිශ්‍රයේ වත්ත ද දකුණට : සිරිපිනා පටුමග වරිපනම් අංක 43 දරන පරිශ්‍රයද, බස්නාහිරට : 1

වන මොස්ක් පටුමග ද, යන මායිම් ඇතුළත ඉහත කී අංක 3586 දරන පිඹුර ප්‍රකාර පර්චස් අටයි දශම එකයි දෙකක් (අ. 0, රූ. 0. පර්. 8.12) විශාලත්වය ඇති බිම් කට්ටිය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගමේ ලේකම්.

06-118/7

---

## කොමර්පල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් මගින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි (මිනුවන්ගොඩ ශාඛාව)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් විසින් මා වෙත පවරා ඇති බලය ප්‍රකාර,

01. බලයලත් මානක කේ. කනගසිංහම් විසින් 1991 අප්‍රේල් මස 28 වන දින සාදන ලද අංක : 1406 දරන පිඹුර පරිදි බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ මීගමුව ලියාපදිංචි කොට්ඨාසය තුළ දාසිය පත්තු අළුත්කුරු කෝරලේ මාතම්මන පිහිටි වලව්වෙවත්ත *හෙවත්* නුගගහවත්ත නමැති ඉඩමේ වෙන්කොට ලකුණු කරන ලද ලොට් 47 දරන රූඩ් තුනයි පර්චස් දාහතක් (අ. 0, රූ. 3, පර්. 17) විශාල ඉඩම සහ එහි තුළ පිහිටි සියලුදේත් සමග වේ.

02. බලයලත් මානක ඩබ්. ඩී. එන්. සෙනවිරත්න විසින් 1992 ජූනි මස 01 වැනි දින සාදන ලද අංක : 1382 දරන පිඹුර පරිදි බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ (මීගමුව ලියාපදිංචි කොට්ඨාසය තුළ) දාසිය පත්තු අළුත්කුරු කෝරලේ, මිනුවන්ගොඩ නගර සභා සීමාව තුළ වැගොව්ව පිහිටි දිවුලපිටිය පාරේ වරිපනම් අංක : 184 දරන අඹගහවත්ත *හෙවත්* බුළුගහවත්ත ඉඩමේ බෙදා වෙන් කරන ලද ලොට් 19 දරන පර්චස් දාහතයි දශම දෙකක් (අ. 0, රූ. 0, පර්. 17.2) විශාල ඉඩම සහ එහි පිහිටි ගසකොළ, ගොඩනැගිලි සහ සියළු දේත් සමග වේ.

වැවිට විදානලාගේ දොන් විමල් රංජිත් ණයකරු හැටියට ද, ඔහු විසින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ්ට උකස් කරන ලද ඉහත සඳහන් කළ දේපළ, වර්ෂ 2006 ක් වූ ජූනි මස 27 වන දින පෙරවරු 11.30 ට එම දේපළ පිහිටි ස්ථානයන්හි දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2006.03.10 වන දින රජයේ *ගැසට් පත්‍රය* සහ ලංකාදීප, ද අයිලන්ඩ් සහ තිනකරන් පුවත්පත් බලන්න. විකිණීම පිළිබඳ දැන්වීම සඳහා 2006.06.02 වන දින රජයේ *ගැසට් පත්‍රය* ද, 2006.06.02 වන දින ලංකාදීප සහ ද අයිලන්ඩ් පුවත්පත් බලන්න.

*ඉඩමට පිවිසීම.*– ඉහත දේපළට ළඟාවීමට නම් කොළඹ සිට මීගමුව ප්‍රධාන මාර්ගයේ (ඒ 3) කිලෝමීටර් 15 ක් පමණ දුර ගමන් කර ජා ඇල නගරයට ගොස් එතැනින්, මිනුවන්ගොඩ පාර දෙසට හැරී(කොළඹ- කුරුණෑගල මහා මාර්ගය හරහා මිනුවන්ගොඩ, දිවුලපිටිය කොටදෙණියාව ආදී මාර්ග අංක ඒ 5) කිලෝමීටර් 11.25 ක් පමණ ඉදිරියට ගමන් කරමින් කිලෝමීටර් 03 ක් පමණ ගිය පසු මිනුවන්ගොඩ බසාර් එක හමුවේ. වැගොව්ව ප්‍රාදේශයට ඇතුළු විය හැක. එතැනින් දකුණට හැරී වැගොව්ව පාරේ සිට දැනට ලේෆ්ට්නන්ට් චමල් මාවත නම් වේ. මීටර් 75 ක් පමණ ගමන් කර නැවතත් වමට හැරී අඩි 20 ක් පමණ පළල් බොරළු සහිත පාරේ ගමන් කර බ්ලොක් ක්‍රමයට ඉඩම් කට්ටි කර ඇති තුන්වන ඉඩම් කට්ටියට පසු අදාළ දේපළ පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.*– විකිණීම ස්ථිර කළ වහාම ගැනුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතුයි:

01. ගැනුම් මිළෙන් සියයට දහයක්(10%);
02. පළාත් සභා අයබදු සඳහා සියයට එකක් (01%);
03. වෙන්දේසිකරුගේ කොමිස් මුදල් ගැනුම් මිලෙන් සියයට දෙකයි දශම පහක් (2.5%);
04. නොතාරිස් ගාස්තුව රු. 2,000;
05. ලිපිකරු සහ සෝෂක වේතය රු. 500;
06. වෙන්දේසිය සඳහා වැයකරන ලද සියළුම ප්‍රචාරක වියදම්;
07. ගැනුම් මිලෙන් ඉතිරි සියයට අනූව (90%) විකිණීමේ දින සිට දින 30 ක් තුලදී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් හි ප්‍රධාන කාර්යාලයේ හෝ මිනුවන්ගොඩ ශාඛාවේ තැන්පත් කල යුතුය.

හිමිකම් ඔප්පු පරීක්ෂා කිරීම සහ වැඩි විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න :

කළමනාකරු,
කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ්,
අංක 42, සිරිවර්ධන මාවත,
මිනුවන්ගොඩ.
දුරකථන අංක : 011-2296223
011-2296220 -1
ෆැක්ස් අංකය : 011-2295309

එල්.බී. සේනානායක - සාම විනිසුරු,
බලයලත් ජ්‍යොෂ්ඨ වෙන්දේසිකරු, තක්සේරුකරු
සහ උසාවි කොමසාරිස්, කොළඹ වාණිජ
මහාධිකරණය සහ දිසාඅධිකරණය,
බලයලත් ජ්‍යොෂ්ඨ වෙන්දේසිකරු,

රාජ්‍ය බැංකු සහ වාණිජ බැංකුව.
අංක 99, උසාවිය පාර,
කොළඹ 12.
දුරකථන/ෆැක්ස් අංක : 2445393

06-105

---

## සීමාසහිත සෙලාන් බැංකුව - මීරිගම ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ, පදිංචියට හෝ වගාවට සුදුසු ඉතා වටිනා දේපලක් වෙන්දේසියේ විකිණීම

මීරිගම ප්‍රාදේශීය සභා සීමාව තුළ මිනිඔලුව ගමේ පිහිටි "කුකුරුමානේ කැලේ "නැමැති බෙදා වෙන්කල ඉඩමේ කොටස හා එහි තුල පිහිටි ගහකොල වගාව ඇතුළු අනෙකුත් සියලු දේ, ඉඩමේ ප්‍රමාණය : අක්කර 01, රූඩ් 01, පර්චස් 18.6 යි.

මෙම දේපල පුරාණ මීරිගම, මීරිගම පදිංචි කුඩා ඉඹුලානගේ සරත් නන්දසිරි සහ කාරියවසම් පටුවත් විතානගේ ඇසැලින් හේමලතා යන අය බන්ධනදායීන් වශයෙන් සීමාසහිත සෙලාන් බැංකුව වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

2006 ක් වූ ජූනි මස 21 වන දින ප.ව.2.30 ට එම දේපල පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2005.08.12 වන දින රජයේ *ගැසට් පත්‍රය*ද 2005.08.03 වන දින දිනමිණ, ඩේලිනිවුස් සහ තිනකරන් යන පුවත්පත් බලන්න.

*ඉඩමට පිවිසීම.–* මීරිගම නගරයේ සිට ගිරිඋල්ල මාර්ගයේ සිට කිලෝමීටර් 3.5 ක් පමණ කදන්ගමුව පාසැල් හන්දිය දක්වා ගමන්කර වමට ඇති පන්සල පාරට හැරී මීටර් 400 ක් පමණ ගමන්කර නැවත වමට ඇති සුසාන භූමිය පාරට පිවිස මීටර් 250 ක් පමණ ගමන්කල විට මෙම පාරේ වම් පසින් සුසාන භූමිය ඉදිරියෙන් අදාළ දේපල පිහිටා තිබේ.

*ගෙවීමේ ක්‍රමය.–* විකිණීම ස්ථිර කළ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතුවේ.

ගැනුම් මිලෙන් 10% (සියයට දහයක්), ප්‍රාදේශීය සභා බදු සඳහා 01% (සියයට එකයි), වෙන්දේසිකරුගේ කොමිස් මුදල 2 1/2% (සියයට දෙකහමාරක්) නොතාරිස් ගාස්තුව විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2000 ලිපිකරු හා සෝෂක වේතනය රු. 500 සියලුම ප්‍රචාරක වියදම් ද, ගැනුම් මිලෙන් ඉතිරි 90% (සියයට අනූවක්) විකිණීමේ දින සිට දින 30 ක් ඇතුළතදී සීමාසහිත සෙලාන් බැංකුවට ගෙවා නිමකළ යුතුවේ.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න :
ප්‍රධාන කළමනාකරු (නීති), සීමාසහිත සෙලාන් බැංකුව, සෙලින්කෝ සෙලාන් ටවර් ගොඩනැගිල්ල. අංක 90, ගාලු පාර, කොළඹ 03.
දුරකථන : 011-4701283, 011-2456284, 077-7736452

අයි. ඩබ්ලිව්. ජයසූරිය,
අධිකරණ හා වාණිජ බැංකු පිළිගත් වෙන්දේසිකරු,
අංක 83/5, බෝමලුව පාර, වටපුළුව, මහනුවර.

දුරකථන : 071-4755974, 071-4213497, 071-2755974.

06-113/3

---

## සීමාසහිත සම්පත් බැංකුව

### 1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය යටතේ විකුණුම් නිවේදනයයි

අනුක එන්ටර්ප්‍රයිසස් - ගිණුම් අංක : 0028 1000 0395

1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2003.06.26 දාතමින් යෝජනා කොට සම්මත කර ගනු ලැබ, 2003.12.26 දින රජයේ *ගැසට් පත්‍රයේ* සහ 2003.12.12 වන දින දිනමිණ, ඬේලිනිවුස් සහ තිනකරන් යන දිනපතා පුවත්පත් වලද පල කරන ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් අට ලක්ෂ හතලිස් පන් දහස් දෙසීය හැත්තෑවයි ශත හතලිස් දෙකක (රු. 8,45,270.42) මුදල හා සමග තවත් රුපියල් හත් ලක්ෂ හැත්තෑ අට දහස් තුන්සිය පනස් අටයි ශත හතලිස් හතරක (රු. 7,78,358.44) ක මුදල සඳහා වසරකට සියයට විසි තුන (23%) බැගින් 2003 පෙබරවාරි 07 වන දින සිට වෙන්දේසි දින දක්වා තවදුරටත් පොලී මුදල්ද සමග ප්‍රචාරක වියදම් හා වෙනත් වියදම් වෙතොත් ඒවාද සමග එතෙක් ගෙවා ඇති යම් මුදලක් (වේ නම්) අඩුකොට අය කර ගැනීම සඳහා මෙහි පහත උපලේඛනයේ මැනැවින් විස්තර කොට ඇති දේපල හා පරිශ්‍රය මහනුවර බලයලත් වෙන්දේසිකරු අයි. ඩබ්ලිව්. ජයසූරිය විසින් 2006.06.23 දින පෙ.ව. 10.30 ට පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### උපලේඛනය

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, වැඋඩ විල්ලි හත්පත්තුවේ මහගල්බොඩ මෙගොඩ කෝරලේ මියාහීල්ලේ පිහිටි උයන්දන එස්ටේට් නැමැති ඉඩමෙන් බලයලත් මිනින්දෝරු එම්. ඩබ්ලිව්. ආරියරත්න විසින් සාදන ලද 1998 ජනවාරි 07 දාතම හා අංක 1324 දරන පිඹුරේ ලොට් 1 B වශයෙන් ලකුණු කොට නිරූපිත උතුරට: අංක 1324 පිඹුරේ ලොට් 1 A ද, නැගෙනහිරට: අංක 25/86 පිඹුරේ ලොට් 41 ද, දකුණට: අංක 25/86 පිඹුරේ ලොට් 43 ද සහ බටහිරට : නිවාස වල සිට රිදීගම ප්‍රධාන පාර දක්වා දිවෙන පාරද මායිම් වන, ප්‍රමාණයෙන් පර්චස් දොලහයි දශම එකයි හතරක් (අක්. 0, රූඩ්. 0, පර්. 12.14) වන කුරුණෑගල ඉඩම් කාර්යාලයේ වෙළුම/පත්‍රුරුව A1377/126 හි ලියාපදිංචි කොට ඇති බෙදා වෙන් කොට සීමා නිර්නය කළ සම්පූර්ණ බිම් කොටස එහි පස ගහකොල වගාවන් ගොඩනැගිලි සහ වෙනත් සියළු දේ සමගය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගමේ ලේකම්.

06-118/3

---

## ජාතික ඉතිරිකිරීමේ බැංකුව

### සංශෝධිත පරිදි වූ 1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වන වගන්තිය යටතේ විකිණීම

ජාතික ඉතිරිකිරීමේ බැංකුව සතු අගනා දේපලක් වෙන්දේසියේ විකිණීම

ඌව පලාතේ මොණරාගල දිස්ත්‍රික්කයේ බිබිල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ, වැගම්පත්තු වෙල්ලස්ස කෝරලයේ, දොඩන්ගොල්ල ගමේ පිහිටි “කීනලන්ද” නැමැති ඉඩමේ ලොට් අංක 06 දරන පර්චස් 23 ක විශාලත්වය ඇති නිවසක් සහිත ඉඩම.

### දේපල විස්තරය

ඌව පළාතේ, මොණරාගල දිස්ත්‍රික්කයේ, බිබිල කොට්ඨාසයේ, වැගම්පත්තු වෙල්ලස්ස කෝරලේ, බිබිල ප්‍රාදේශීය සභා සීමාව ඇතුලත දොඩන්ගොල්ලේ පිහිටි කීනලන්ද නැමැති ඉඩමේ, බලයලත් මිනින්දෝරු එස්. පී. රත්නායක විසින් මැන සාදන ලද අංක 544 හා 1993 දෙසැම්බර් 09 දින දරන පිඹුරේ පෙන්නුම් කර තිබෙන, ලොට් අංක 06 ලෙස ලකුණු කළ, බෙදා වෙන් කළ බිම් කට්ටියට උතුරු දිගින් පාරද (ඔප්පුවට අනුව ගම්සභා පාර), නැගෙනහිර දිගින්, රජයේ ඉඩමද, දකුණු දිගින් ශාන්ත හේරත් හිමිකම් කියන ඉඩමද, බස්නාහිර දිගින් ලොට් අංක 5 ද, මායිම් වී ඇති එකී අංක 544 දරන පිඹුර ප්‍රකාර පර්චස් විසිතුනක් (අ. 0, රූ. 0, පර්. 23) නොහොත් හෙක්ටයාර බින්දුවයි දශම බින්දුවයි පහයි නවයක (හෙ. 0.059) විශාලත්වයක් ඇති බිම් කට්ටිය වේ. මෙය මොණරාගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ K61/73 යටතේ ලියාපදිංචි වී ඇත.

මෙම දේපල ජාතික ඉතිරිකිරීමේ බැංකුවට උකස් තබා ඇත්තේ, බිබිල, දොඩම්ගොල්ල, කීනලන්ද වත්තේ ආර්. ඩී. සමරසිරි මහතා විසිනි.

*දේපලට ළඟා වීම.–* බිබිල - මොණරාගල පාරේ කිලෝමීටර් 2 ක් ගියවිට වමට ඇති බොරළු පාරේ මීටර් 150 ක් ඇතින් දකුණු පස අදාළ දේපල පිහිටා ඇත.

මෙම දේපල අප විසින් 2006 ජූනි මස 23 සිකුරාදා දින පෙ.ව. 11.00 ට දේපල පිහිටි ස්ථානයේදී, ඊට අයත් සියළු දේ සමග ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*ගෙවීමේ ක්‍රමය.–* සාර්ථක ගැණුම්කරු විසින් වෙන්දේසිය නිම වූ වහාම පහත සඳහන් මුදල් ප්‍රමාණයන් ගෙවිය යුතුය.

1. ගැණුම් මිලෙන් 25%
2. ගැණුම් මිලෙන් 1% ක් ප්‍රාදේශීය සභා අයබදු ලෙස ගෙවිය යුතුය.
3. ගැණුම් මිලෙන් 2 1/2% ක් වෙන්දේසිකරුගේ කොමිස් මුදල ලෙස ගෙවිය යුතුය.
4. රු. 50,050 නොඉක්මවන සම්පූර්ණ ප්‍රචාරක ගාස්තු වියදමෙන් 50% ක්
5. ලිපිකරුගේ හා සෝෂක කරුගේ ගාස්තුව රු. 500
6. විකුණුම් කොන්දේසි සහතික කිරිමේ නොතාරිස් ගාස්තුව වශයෙන් රු. 3,000 ක් ගෙවිය යුතුය.

ගැණුම් මිලෙන් ඉතිරි වූ 75% මුදල, වෙන්දේසි දින සිට දින 30 ක් තුල බැංකුව වෙත ගෙවිය යුතුය.

වැඩිදුර විස්තර සහ විකුණුම් කොන්දේසි සඳහා :-

සහකාර සාමාන්‍යධිකාරි (ණය),
ජාතික ඉතිරිකිරීමේ බැංකුව,
අංක 255, ගාලු පාර,
කොළඹ 03.
දුරකථන අංක : 2576132.

ශ්‍රී ලංකාවේ බැංකු සඳහා පිළිගත් පුරෝගාමී වරලත් වෙන්දේසිකරුවෝ සහ තක්සේරුකරුවෝ

ෂොක්මන් සහ සමරවික්‍රම

| *අගනුවර කාර්යාලය* | *ප්‍රධාන කාර්යාලය* |
|---|---|
| අංක 55 ඒ, ධර්මපාල මාවත, කොළඹ 03. | අංක 24, ටොරින්ටන් පාර, මහනුවර |
| දුරකථන අංක : 01-2448526<br>01-2441761 | දුරකථන අංක : 081-2224371<br>081-2227593 |
| ෆැක්ස් : 01-2448526 | ෆැක්ස් : 081-2224371 |
| ඊමේල් : සමර@ශ්‍රීලංකා.නෙට් | ඊමේල් : සමර@ඩයමන්ඩ්.ලංකා.නෙට් |

06-41

---

## සීමාසහිත සම්පත් බැංකුව

### 1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය යටතේ විකුණුම් නිවේදනය

ඒ. කරල්ලියද්ද සහ ඒ. ජේ. කරල්ලියද්ද - ගිණුමේ අංක 0007 5006 7379

1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2004.03.25 වන දින යෝජනා කොට සම්මත කර ගනු ලැබ 2004.06.04 දින රජයේ *ගැසට් පත්‍රයේ* සහ 2004.05.25 දින 'දිවයින', 'අයිලන්ඩ්' සහ 'තිනකුරල්' යන දිනපතා පුවත්පත් වල ද පල කරන ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් විසිතුන් ලක්ෂ තුන්දහස් තුන්සිය හතලිස් අටයි ශත හතලිහක (රු.2,303,348.40) මුදල ද සහ තවත් රුපියල් දාහතර ලක්ෂ හැටහතර දහස් දාහතයි ශත අනූ හයක (රු.14,64,017.96) මුදල සඳහා වසරකට සියයට දාහත (17%) බැගින් ද තවත් රුපියල් පන්ලක්ෂයක (රු.500,000) මුදල සඳහා වසරකට සියයට දහනවය (19%) බැගින් ද 2003 මාර්තු 01 වන දින සිට වෙන්දේසි දින තෙක් තවදුරටත් පොලී මුදල ද, ප්‍රචාරක වියදම් සහ වෙනත් අයකිරීම් වෙතොත් ඒවා ද සමග, එතෙක් ගෙවා ඇති යම් මුදලක් (වේ නම්) අඩුකොට අයකර ගැනීම සඳහා මෙහි පහත උපලේඛනයේ, වඩාත් මැනවින් විස්තර කොට ඇති දේපල හා පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකරු ෂොක්මන් සහ සමරවික්‍රම විසින් 2006.07.12 දින පස්වරු 3.00 ට පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ සල්පිටි කෝරලේ පල්ලෙ පත්තුවේ, කොළඹ මහ නගර සභා සීමාව තුළ, නාගරික කොට්ඨාස අංක 44 කිරුලපොන 1 වන පටුමගේ පිහිටි දැනට 1 වන පටුමග වරිපනම් අංක 40/1 දරන හා කලින් වරිපනම් අංක 34/1, වූ බලයලත් මිනින්දෝරු හා තලමිතිකරු එස්. ධර්මවර්ධන විසින් හැඩවකගහවත්ත නැමැති ඉඩමෙන් මැන සාදන ලද 1971 අගෝස්තු 21 දාතම හා අංක 486 දරන පිඹුරේ නිරූපිත, ලොට් B වශයෙන් ලකුණු කොට දක්වා ඇති කොළඹ ඉඩම් කාර්යාලයේ වෙළුම/පත්තිරුව කිරුල 142/166 යටතේ ලියාපදිංචි කොට ඇති එකී ලොට් B පිඹුරට අනුව උතුරට : ලොට් A ද, නැගෙනහිරට : ලොට් 5481 D සහ 5481F ද, දකුණට: ලොට් 5481F සහ 5481 H (පාර)ද සහ බටහිරට : ලොට් C ද මායිම් වන ප්‍රමාණයෙන් පර්චස් දොලහයි දශම එකයි අටක් (අක්. 0, රූඩ්. 0, පර්. 12.18) වන බෙදා වෙන් කොට සීමා නිර්නය කළ සම්පූර්ණ ඉඩම එහි පිහිටි ගොඩනැගිලි හා වගාවන් ද සමගය.

මතු සඳහන් මාර්ග අතරින්, මතින් හා ඔස්සේ මාර්ග අයිතිය ද හා සමගය.

1. ඉහත කී කරුලපොන පිහිටි හැඩවකගහවත්ත නැමැති ඉඩමේ ඉහත කී අංක 486 පිඹුරේ නිරූපිත මාර්ගය සඳහා වෙන් කල කොටසක් වන ලොට් C වශයෙන් ලකුණු කොට දක්වා ඇති කොළඹ ඉඩම් කාර්යාලයේ වෙළුම/පත්තිරුව කිරුල 148/30 හි ලියාපදිංචි කොට ඇති එකී අංක 486 දරන පිඹුරට අනුව, උතුරට : එකී පිඹුරේ ලොට් A ද, නැගෙනහිරට : එකී අංක 486 දරන පිඹුරේ ලොට් B ද, දකුණට : පිඹුරු අංක 4 (කිරුලපොන) හි ලොට් 5481 H ද සහ බටහිරට : ලොට් 5481E 3 (පාර) ද මායිම් වන ප්‍රමාණයෙන් පර්චස් එකයි දශම එකයි හයක් (අක්. 0, රූඩ් 0, පර්. 1.16) වන සම්පූර්ණ බිම් කොටස.

2. ඉහත කී කිරුලපොන හැඩවකගහවත්ත නැමැති ඉඩමෙන් බලයලත් මිනින්දෝරු ආර්. එම්. ජලීල් විසින් සාදන ලද 1956 ජූනි 11 දාතම හා අංක 8/1956 දරන ඉහත කී පිඹුරේ ලොට් 5481 E 3 වශයෙන් ලකුණු කොට දක්වා ඇති කොළඹ ඉඩම් කාර්යාලයේ වෙළුම/පත්තිරුව කිරුල 146/08 හි ලියාපදිංචි කොට ඇති එකී අංක 8/1956 දරන පිඹුරට අනුව, උතුරට: ලොට් 5481 C ද නැගෙනහිරට: ලොට් 5481 E 1 සහ ලොට් 5481 E 2 ද දකුණට: ලොට් 5481 H (මාර්ගය සඳහා වෙන්කල කොටස) ද සහ බටහිරට: ලොට් 548 A (පාර) ද මායිම් වන ප්‍රමාණයෙන් පර්චස් හතරයි දශම එකයි නවයක් (අක්. 0, රූඩ් 0, පර්. 4.19) වන සම්පූර්ණ ඉඩම් කොටස (පාරට වෙන්කල කොටස)

3. ඉහත කී කිරුලපොන හැඩවකගහවත්ත නැමැති ඉඩමෙන් බලයලත් මිනින්දෝරු ආර්. එම්. ජලීල් විසින් සාදන ලද 1948 මාර්තු 16 දාතම හා අංක 1 දරන පිඹුරේ ලොට් 5481 H වශයෙන් ලකුණු කොට නිරූපිත කොළඹ ඉඩම් කාර්යාලයේ කිරුල 153/30 යටතේ ලියාපදිංචි කොට ඇති එකී අංක 1 පිඹුරට අනුව උතුරට : ලොට් 5481 A සහ 5481 E ද, නැගෙනහිරට : සහ දකුණට : එකී පිඹුරේ ලොට් 5481 F ද සහ බටහිරට : දෙවට පාරද මායිම් වන ප්‍රමාණයෙන් පර්චස් හතරයි දශම හතරයි බිංදුවක් (අක්. 0, රූඩ් 0, පර්. 4.40) වන සම්පූර්ණ ඉඩම් කොටස (පාරට වෙන්කල කොටස)

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගමේ ලේකම්.

06-118/5

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන සංශෝධිත ගාස්තු

1995 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මක වේ.

(සෑම සිකුරාදා දිනයන්හි පළ කරනු ලැබේ.)

1. සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.

2. පෞද්ගලික පළකරන්නන්ගේ සියළුම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, රජයේ මුද්‍රණාලයාධිපති තැනට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාර දීමට හෝ පුළුවන.

3. කාර්යාල වේලාවන් පෙරවරු 9.00 සිට පස්වරු 4.45 දක්වා වේ.

4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.30 සිට පස්වරු 3.30 දක්වා බව සැලකිය යුතුයි.

5. සියළුම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. තැපෑලෙන් දැන්වීම් සහ ප්‍රකාශනයන් එවන විට ඒ සමගම අයවිය යුතු ගාස්තුව සඳහා මනි ඕඩරයක්, පෝස්ටල් ඕඩරයක් හෝ චෙක් පතක් රජයේ මුද්‍රණාලයාධිපති තැනට එවිය යුතුය.

6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත ඩිපිටපතඩ් කඩදාසියේ එක් පැත්තක පැහැදිලිව ටයිප් ගසා එවිය යුතුයි. අත් අකුරින් යුතු කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.

7. සෑම අත්සනකටම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතුයි.

8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් හෝ පළ කරනු නොලැබේ.

9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළායයි හැඟෙන ප්‍රකාශන සුප්‍රීම් උසාවියේ පෙරකදෝරු මහතෙකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.

10. 1995 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේයි :-

| | රු. ශ. |
|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව | 51 0 |
| වැඩිවන සෑම අඟලකටම හෝ ඉන් කොටසකටම | 51 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට | 504 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට | 1,008 0 |

(අඟලේ සෑම කොටසකටම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)

11. සෑම සිකුරාදා දිනයකම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය පළකරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

12. සෑම මාසයකම මුල් සතියේ ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි.

13. 1995.01.01 දින සිට සංශෝධිත දායක ගාස්තුව* :-

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* - (වාර්ෂික)

| | මෙරට රු. ශ. | පිටරට රු. ශ. |
|---|---|---|
| I වන කොටස සම්පූර්ණයෙන් (I, II, III ජේද තුනම ඇතුළත්) | 1,612 0 | 2,098 0 |
| II වන කොටසේ සිට VI වන කොටස දක්වා එක කොටසක් | 572 0 | 745 0 |
| I වන ජේදය | 520 0 | 1,007 0 |
| II වන ජේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර්, විභාග ආදිය) | 624 0 | 1,009 0 |
| III වන ජේදය | 468 0 | 907 0 |
| අති විශේෂ ගැසට් පත්‍රය | 3,360 0 | 4,422 0 |

ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ 12 මාසයකට නොඅඩු කාලසීමාවකට පමණය.

*තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | | මිළ ගාස්තුව රු. ශ. | තැපැල් (මෙරට) රු. ශ. |
|---|---|---|---|
| (අ) | I වන කොටස | 31 0 | 5 0 |
| | II වන කොටසේ සිට VI වන කොටස දක්වා එක කොටසක් | 11 0 | 5 0 |
| (ආ) | I වන ජේදය | 10 0 | 5 0 |
| | II වන ජේදය | 12 0 | 5 0 |
| | III වන ජේදය | 9 0 | 5 0 |

* දායක මුදල් භාරගැනීම සහ තනිපිටපත් විකිණීම භාර කොළඹ 01 ලෝටස් පාර, අංක 32හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත මුදල් ලැබෙන්නට සළස්වන්න.

## ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනයද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවත් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා ගැසට් පත්‍රයට දැන්වීම ඇතුළත් වෙනවාත් හැර එය සියළු දෙනාගේම පහසුවටද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දායක මුදල් භාර නොගනී. සියළුම දායක මුදල් කොළඹ 01, ලෝටස් පාර, අංක 32හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කෙළින්ම ගෙවිය යුතුය.**

*සැලකිය යුතුයි.*- මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත නොව ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

**2006**

| *මාසය* | *පළකිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| ජූනි | 2006.06.02 | සිකුරාදා | 2006.05.19 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2006.06.09 | සිකුරාදා | 2006.05.26 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2006.06.16 | සිකුරාදා | 2006.06.02 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2006.06.23 | සිකුරාදා | 2006.06.09 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2006.06.30 | සිකුරාදා | 2006.06.16 | සිකුරාදා | දහවල් | 12.00 |
| ජූලි | 2006.07.07 | සිකුරාදා | 2006.06.23 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2006.07.14 | සිකුරාදා | 2006.06.30 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2006.07.21 | සිකුරාදා | 2006.07.07 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2006.07.28 | සිකුරාදා | 2006.07.14 | සිකුරාදා | දහවල් | 12.00 |
| අගෝස්තු | 2006.08.04 | සිකුරාදා | 2006.07.21 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2006.08.11 | සිකුරාදා | 2006.07.28 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2006.08.18 | සිකුරාදා | 2006.08.04 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2006.08.25 | සිකුරාදා | 2006.08.11 | සිකුරාදා | දහවල් | 12.00 |

**ලක්ෂමන් ගුණවර්ධන,**
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

2006 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.